## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව - 2017

-----------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 15 දරන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන මණ්ඩල පනතේ 17 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

**තත්ත්වාගණනය කළ මතය- සමූහය**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය- සංස්ථාව**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - (සමූහය)**

සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන එහි පරිපාලිතයන් වූ සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ( පුද්ගලික) සමාගමේ සහ සී/ස එල්ආර්ඩීසී සේවා (පුද්ගලික ) සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර තිබුණු අතර පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් සංස්ථාවේ හිමිකාරිත්වය සියයට 80 ක් විය.

පහත සඳහන් නිරීක්ෂණ පදනම් කරගෙන සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය තත්ත්වාගණය කර තිබුණි.

(අ) 2015 ජූලි 15 දින ආයතනය විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගන්නා ලද රු.4,508,000 වූ සිමෙන්ති ගල් සැකසීමේ යන්ත්‍රය හා රු.2,695,000 ක සිමෙන්ති ගල් සැකසීමේ තැටි, මිලදී ගත් දින සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබුණු අතර යන්ත්‍රය වෙනුවෙන් වූ හානිකරණ අලාභයද කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 27.5 වගන්තියට අනුව (Impairment Loss) හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි සමාගම භාවිතයට ගෙන තිබූ රු.4,216,275 ක් වටිනා ගොඩනැගිලි, කුඩා හා මධ්‍ය පරිමාන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17.4 වගන්තියට අනුව ගිණුම් ගත නොකර කෙරිගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි වල වටිනාකම ඌන ගණනය වී තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව විෂයන් 5 කට අදාලව වටිනාකම රු. 18,102,359 ක සඳහා විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ශේෂයන් 6 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් ඊට අදාල උපලේඛනවල අදාල ශේෂයන් සමග සසඳා නොතිබුණු අතර ඒ අතර රු. 32,712,441 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සංස්ථාව

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් සාධාරණ අගය (Fair Value) මත ඉදිරිපත් කල යුතු වුවද සංස්ථාව විසින් පිරිවැය රු.මිලියන 2,071.41 ක දේපල පිරියත උපකරණ වල සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදි සංස්ථාව විසින් ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමට මාසික වාරික 53 කින් නැවත අය කර ගැනීමේ පදනම මත රු. මිලියන 25 ක ණය මුදලක් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට එම ණය මුදලින් කෙටි කාලීන හා දිගු කාලීන ලෙස සංස්ථාවට ලැබිය යුතු ණය ශේෂයන් ප්‍රමිතයේ 56 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් යටතේ වෙන් වෙන්ව දක්වා නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

විදේශීය විනිමය හුවමාරු අනුපාතය වෙනස්වීම මත ඇතිවන උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් යටතේ දැක්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ රු.මිලියන 14 ක විදේශ විනිමය හුවමාරු අනුපාතයේ වෙනස්වීම මත ඇතිවූ අලාභය එලෙස දක්වා නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11**

සංස්ථාව විසින් සිදු කරමින් පවතින ඉදිකිරීම් (Ongoing Construction) කොන්ත්‍රාත් වල ආදායම, පිරිවැය හා ලාභය නිමවුම් ප්‍රතිශත ක්‍රමය (Stage of Completion) මත හඳුනාගන්නා බව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර තිබුණද කොන්ත්‍රාත් ආදායම, පිරිවැය හා ලාභය ප්‍රමිතයෙහි සඳහන් නියමයන්ට අනුව හඳුනාගෙන නොතිබුණි. සහතික කළ වැඩ සඳහා වැයකරන ලද පිරිවැය, අදාල ආදායම හා වියදම සමඟ ගැලපීමට හැකිවන පරිදි හඳුනාගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ සංස්ථාව සිදුකරන ලද කොන්ත්‍රාත් 48 කින් හඳුනාගන්නා ලද කොන්ත්‍රාත් ආදායම රු.58,366,302 කින් ඌන ගණනය වී තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 762.34 ක්වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38**

-----------------------------------

ප්‍රමිතයේ 118 ඡේදය ප්‍රකාරව සංස්ථාව සතු පරිගණක මෘදුකාංග වෙනමම හඳුනාගෙන නොතිබුණු අතර ඒ සම්බන්ධව ප්‍රමිතය ප්‍රකාරව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

-----------------------------------

ප්‍රමිතය ප්‍රකාරව සංස්ථාවේ මූල්‍ය වත්කම් (Financial Assets) වර්ගීකරණය කර නොතිබුණි.

**(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40**

-----------------------------------

(i) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පිරිවැය රු.මිලියන 101.35 ක ආයෝජන දේපල දෙකකට අදාල සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර පිරිවැය රු. මිලියන 1,259.74 ක් වූ ඉඩම් අක්කර 88 ක සාධාරණ අගය රු.මිලියන 5,634.52 ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද, ඒ වෙනුවෙන් රජයේ තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබා නොගෙන එම ඉඩම්වලට යාබද ඉඩම් වෙනුවෙන් රජයේ තක්සේරුකරු ලබාදුන් තක්සේරුව පදනම් කර ගනිමින් සංස්ථාව විසින් සාධාරණ අගය (Fair value) ගණනය කර තිබුණි.
එමෙන්ම සංස්ථාව කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු ඉඩම්, ආයෝජිත දේපළ ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබූ අතර එම ඉඩම්වල වටිනාකම පිළිබඳ තොරතුරුද විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට රු.360,000 කට සංස්ථාව දිගු කාලීනව බදු දී ඇති ඉඩම් 03 ක වටිනාකම ආයෝජන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(iii) සංස්ථාව ඔරුගොඩවත්ත ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යනු ලබන රූඩ් 2 පර්චස් 20 ක පමණ ඉඩම සහ එයට අයත් ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට අයත් දියත උයන ආපන ශාලාව වෝටස් ඒජ් සමාගමට රු.මිලියන 88.42 කට පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට ලැබිය යුතු එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

(ආ) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි වලට අදාළ ඉකුත් වර්ෂයේ ක්ෂය වටිනාකම වූ රු. මිලියන 1.40 ක් සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන්ම ඌන ගණනය වී තිබුණි.

(ඇ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී දියත උයන පරිශ්‍රයේ ඉදිකරන ලද වෙසක් වේදිකාව වෙනුවෙන් දරන ලද පිරිවැය තුළ ඇතුළත් රු. 206,573 ක ප්‍රාග්ධන නොවන වියදම්, අදාල වත්කම්හි ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ වටිනාකම, එම අගයෙන්ම අධිගණනය වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අඩමාන ණය අධිවෙන්කිරීම් රු.134,036,755 ක් විකුණුම් වියදම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ඉ) සංස්ථාව විසින් 2012 වර්ෂයේ සිට භාවිතයට ගනු ලබන එක්ස්කැවේටර් යන්ත්‍රයක සහ බෝට්ටු 02 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) 2010 වර්ෂයේදී සංස්ථාව සතු ට්‍රැක්ටර් ටේලර 04 ක්, බවුසර් රථ ලෙස නවීකරණය කළද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට අභ්‍යන්තර විගණන වාර්තා මගින් අනාවරණය කර තිබුණු මුදුන්ඇළ මුහුදු වැලි අලෙවි මධ්‍යස්ථානයේ පැවති රු.596,344 ක් වටිනා වැලි කියුබ් 84 ක ඌනතාවය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථා සේවයෙන් විශ්‍රාම ගිය නමුත් පාරිතෝෂික ගෙවීම් සිදුනොකරන ලද සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම වූ රු.2,232,000 ක් පාරිතෝෂිත වෙන් කිරීම් ගිණුමෙන් ඉවත් කර ජංගම වගකීම් යටතේ දක්වා නොතිබීම හේතුවෙන් ජංගම වගකීම් එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වෙන් කිරීම රු. 61,292,000 ක් වුවද, ආදායම් බදු ගණනයේදී එය රු.62,647,663 ක් ලෙස ගළපා තිබීම හේතුවෙන්, බදු අය කළ හැකි ව්‍යවස්ථාපිත ආදායම රු. 1,355,663 කින් හා ගෙවිය යුතු ආදායම් බදු රු. 379,586 කින් අධි ගණනය වී තිබුණි.

(ඒ) විගණනයේ ගණනය කිරීම්වලට අනුව සමාලෝචිත වර්ෂයට අදාල ආර්ථික සේවා ගාස්තුව රු.4,857,423 ක් වුවද එය ගිණුම් ගතකර නොතිබුණි.

(ඔ) වෙනත් ආයතනයක් වෙනුවෙන් සූරිය වැව ඉදිකරණ ලද ගොඩනැගිල්ලකට අදාළව උපදේශන සේවා පිරිවැය ලෙස රු.1.064,340 ක් ගිණුම්ගත කර තිබුණ ද එයට අදාලව ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

**2.3.3 අසම්භාව්‍ය බැරකම්**

----------------------

මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් ලබා ගැනීම සඳහා සංස්ථාව ඇති කර ගත් කොන්ත්‍රාත්තුවේ, සැපයුම්කරු වෙත ගෙවිය යුතු අත්තිකාරම් හා ප්‍රගති බිල් (Progress Bill) සඳහා සංස්ථාව ලබාගත් ඇමරිකානු ඩොලර් මිලියන 19.42 ක ණයවර පහසුකම (Letter of Credit facility) පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිගු කාලීන සේවක ප්‍රතිලාභ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛන අතර රු.2,231,317 ක වෙනසක් වූ අතර ගිණුම් විෂයන් 2 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.96,519,905 ක් වූ අතර ශේෂ සනාථන අනුව මෙම ශේෂයන්හී අගය රු.63,912,369 ක්වී තිබුණි.

(ආ) සංස්ථාවේ වැලි විකුණුම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය තුළ විකුණන ලද මුහුදු වැලි කියුබ් ගණන 237,046 ක් වුවද වැලි තොග ලේඛනය අනුව එය කියුබ් 235,383 ක් වූයෙන් වැලි කියුබ් 1663 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම වූ රු.9,230,850 ක බදු සැසඳීම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ රු. මිලියන 6,052.15 ක ණයගැති හා රු.මිලියන 1,772.85 ක ණයහිමි ශේෂ වටිනාකමින්, විගණනය විසින් කැඳවන ලද සනාථයන්ගේ වටිනාකම පිළිවෙලින් රු. මිලියන 660.98 ක් හා රු.මිලියන 250.63 ක් විය. ඉන් විගණනයට ඉදිරිපත් වූ ණය ගැති හා ණයහිමි ශේෂයන්ගේ සනාථ වටිනාකම් පිළිවෙලින් රු.මිලියන 123.13 ක් හා රු. මිලියන 34.84 ක් වූ අතර සනාථ ඉදිරිපත් නොවූ ණයගැති ශේෂය රු.මිලියන 537.85 ක් හා ණයහිමි ශේෂය රු.මිලියන 215.79 ක් විය.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවාදායක ව්‍යාපෘතිවලින් සංස්ථාවට ලැබිය යුතු මුදල රු. 868,698,232 ක් වූ අතර ඉන් වර්ෂයට අඩු ලැබිය යුතු ශේෂය රු.629,011,353 ක් වූ අතර රු.208,745,944 ක් වර්ෂ 1-5 ත් අතර කාලයක්ද රු. 30,940,932 ක් වර්ෂ 5 ට වඩා වැඩි කාලයක්ද අයනොවී පැවතුණි.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලයට අයත් මුතුරාජවෙල පිහිටි ඉඩමෙන් සංස්ථාව ඉවත්කර ගන්නා ලද වැලි වර්ෂ 05 ක කාලයක සිට නැවත පිරවීමට කටයුතු කිරීමට හෝ එම වැලි ප්‍රමාණයේ තක්සේරු වටිනාකම වූ රු. මිලියන 171 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට විදේශීය සමාගමක් වෙත සංස්ථාව ගෙවිය යුතුව තිබූ යූරෝ 575,000 ක්වූ මුදල පියවීමට කටයුතු නොකිරීම නිසා එම කාලපරිච්ඡේදය තුළ සිදුවූ විනිමය අනුපාත වල අවාසිදායක විචලනයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු මුදල රු.මිලියන 104.93 ක් දක්වා වර්ධනය වී තිබූ අතර රු. මිලියන 14.15 ක විනිමය අලාභයක්ද ලබා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත් ණයහිමි ශේෂය රු.මිලියන 385.76 ක් වූ අතර ඉන් වර්ෂ 2 ත් වර්ෂ 5 ත් අතර නිරවුල් නොකල ශේෂය රු.මිලියන 18.36 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට ලැබුණු වැඩ පූර්ව අත්තිකාරම් ශේෂය වූ රු.මිලියන 495.97 ක් අදාල බිල්පත්‍ර ගෙවීම් කිරීමේදී අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉන් වර්ෂ 02 කට වැඩි ශේෂය රු. 172,755,613 ක් විය. එමෙන්ම සංස්ථාව විසින් උප කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ වැඩ පූර්ව අත්තිකාරම් ශේෂය රු.94,121,853 ක් වූ අතර ඉන් වර්ෂයට වැඩි නිරවුල් නොකළ අගය රු.32,913,574 ක් විය.

(ඊ) නොපියවූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වටිනාකම රු.මිලියන 26.70 ක් විය.

(උ) සංස්ථාව විසින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරිමේ සහ සංවර්ධනය කිරිමේ සමාගමට කුලී පදනම මත ලබාදුන් ඉඩම් හා ගොඩනැගිලි වෙනුවෙන් 2003 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අයවිය යුතු රු.7,650,907 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් පවරාගත් අක්කර 274.5 ක ඉඩම්වලට අදාළව ගෙවිය යුතු වන්දි මුදල වූ රු. මිලියන 62.25 ක් තුළ වර්ෂ 2 ත් 5 ත් අතර නිරවුල් නොකළ ශේෂය රු. මිලියන 19.74 ක් හා වර්ෂ 5 ට වැඩි ශේෂය රු.මිලියන 25.56 ක් විය. එමෙන්ම වන්දි මුදලට අදාළව ගෙවිය යුතු පොලිය රු.මිලියන 106.90 ක් වූ අතර ඉන් වර්ෂ 2 ත් 5 ත් අතර රු. මිලියන 17.67 ක් හා වර්ෂ 5 ට වැඩි රු. මිලියන 71.25 ක් නිරවුල් කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවය හැර ගිය හා සේවයෙන් ඉවත් කළ සේවකයන්ට සංස්ථාව ලබා දී තිබූ ණය රු.137,890 ක් වූ අතර ඉන් වර්ෂ 05 ට වැඩි අය විය යුතු ශේෂය රු.127,890 ක් විය.එමෙන්ම මෙම ණය මුදල් අය කර ගැනීමට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද සංස්ථාව පියවර ගෙන නොතිබුණි.

(ඒ) මැදමුලන ඩී.ඒ. රාජපක්ෂ අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 47.36 ක් ලැබිය යුතු බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව සංස්ථාවට කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව දන්වා තිබුණි.

(ඔ) හම්බන්තොට සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී සංස්ථාවට ලද රු. මිලියන 68 ක සචලිකරණ අත්තිකාරම් මුදල 2018 සැප්තැම්බර් 30 වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු අතර මග නවතා දමා තිබුණි.

(ඕ) 2015 වර්ෂයේදී සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ ඉදිකිරීම් 03 ක වැඩ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත් හිටුවීම මත සංස්ථාවට සිදුවූ වියදම (Demobilization cost) රු.මිලියන 27.29 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අධිකාරියෙන් ලබා ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ක) සංස්ථාව සතු කිඹුලාවෙල පැවැති ආපන ශාලාව සමාගමකට බදු දීම මත ඉකුත් වර්ෂයේ සිට සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 24.58 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත | |
| (i) 2(ආ) 1 වගන්තිය | දිවයින පුරා පලාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට එලෙස ගැසට් කරන ලද පලාත් ගණන 05 කට සීමා වී තිබුණි. |

| | |
|---|---|
| (ii) 8 (අ) වන වගන්තිය | පනතේ 2 වන වගන්තිය යටතේ ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු වුවද, සංස්ථාව විසින් එලෙස 1995 වර්ෂයේදි සංවර්ධන කටයුතු සඳහා පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 419 ක් එනම්, සියයට 52 ක පහල අගයක් විය. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත 11 (බී) වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ස්ථාවර හා කෙටිකාලීන තැන්පත්වල රු.මිලියන 3,123.12 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඇ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය(සංශෝධන) පනතේ 8 ඒ වගන්තිය | අදාළ පළාත් පාලන ආයතනය වෙතින් අනුමැතිය ලබාගැනීමකින් තොරව සංස්ථාව විසින් නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකර තිබුණි. මෙම නිසා ඉදිරි වර්ෂ වලදී අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් රු.මිලියන 12.04 ක පමණ බැරකමක් උද්ගතව තිබුණි. |
| (ඈ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත 113 වන හා 173(2) වගන්තිය | ස්වතක්සේරු පදනම මත කාර්තුමය වශයෙන් බදු සඳහා ගෙවීම් කළ යුතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත බදු වර්ෂය සඳහා ස්වතක්සේරු පදනමින් හතරවන කාර්තුවේදි පමණක් රු.71,046,835 ක් ගෙවීම් කර තිබුනද සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු බද්ද රු.327,091,000 ක් විය. |
| (ඉ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) | • චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 55 කදී රු.100,000 ඉක්මවා රු.11,676,147 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. එසේම මුල්‍ය සීමාවන් ඉක්මවා ගෙවීම් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගෙන නොතිබුණි.<br>• තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුත්තේ කිසියම් විශේෂිත කාර්යයක් සඳහා වුවද, සංස්ථාවේ සාමාන්‍ය කටයුතු වන ඉදිකිරීම් සහ කොන්ත්‍රාත් කටයුතු සඳහා ද සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 36 ක දී රු.6,802,260 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. |
| (ii) සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) | සමාලෝචිත වර්ෂයේ ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිමවලින් වියදම් නොවී ඉතිරිව පැවති අග්‍රිම 09 කට අදාල රු.967,500 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි තවද අදාල කාර්යය අවසන් වී දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ අවස්ථා 19 කදී රු.791,800 ක අතුරු අග්‍රිම පියවීම සඳහා දින 29 සිට දින 221 ක් දක්වා කාලයක් ගතකර තිබුණි. |

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) සංශෝධිත මුදල් රෙගුලාසි 103 | 2010 වර්ෂයේ සිට හානියට පත්වූ පිරිවැය රු.399,677 ක්වූ ට්‍රැක්ටර් ටේලර් 11 ක් සහ 2012 වර්ෂයේදි හානියට ලක්වූ පිරිවැය රු7,651,700 ක් ඩෙජර් යන්ත්‍රය පිළිබඳව රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වත්කම් සංස්ථාවේ වත්කම් ලේඛනය තුළ අන්තර්ගතව තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 139 | සංස්ථාව විසින් මුදල් පොතේ ශේෂයන් පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව චෙක්පත් නිකුත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති බැංකු අයිරා ශේෂය රු. මිලියන 31.79 ක් විය. |
| (iii) මුදල් රෙගුලාසි 237 | අත්තිකාරම් ගෙවීමෙන් පසු හා සැපයුම්කරු විසින් භාණ්ඩ ගබඩාවට භාර දුන් බවට සනාථ වීමෙන් පසු පමණක් අවසන් ගෙවීම සිදු කළ යුතු වුවත් එයට පටහැනිව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදි මිලදී ගන්නා ලද ජල පොම්ප 02 ක් ගබඩාවට ලැබීමට ප්‍රථම එම සැපයුම්කරු වෙත රු.මිලියන 57.28ක් ගෙවා තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 423 සහ 431 (3) | විවිධ සුරකුම්පත්, තැන්පතු සහ ආයෝජන වෙනුවෙන් ආයෝජන ලේඛනයක් (Investment Register) පවත්වා නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් අවසන්ව වර්ෂ 03ට වැඩි කාලයක් ගතවූ කොන්ත්‍රාත් 50 ක රඳවා ගැනීමේ මුදල (Retention) වූ රු.මිලියන 14.23 ක් නිරවුල් කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වැනි පරිච්ඡේදයේ 6:1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වලට අදාළව මුදල් රෙගුලාසියට පටහැනිව වැඩ කල අතිකාල පැය ගණන නොසලකා සංස්ථාව විසින් ඉලක්ක අතිකාල පැය (Target OT) පදනම් කරගෙන සේවකයින් 23 දෙනෙකුගේ වැඩ පැය 1750 ක් වෙනුවෙන් රු.240,805 ක් ගෙවා තිබුණි. |
| (ඌ) | 1993 නොවැම්බර් 26 දිනැති අංක 794/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය | සංස්ථාව විසින් ගොඩදමා තිබුණු මුහුදු වැලි කියුබික් මීටර් 4,478,679 ක් සඳහා ගෙවිය යුතු රාජ්‍ය භාගය රු.මිලියන 135.45 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවා තිබූ වටිනාකම රු.මිලියන 103.65 ක් පමණක් විය. |

| | | |
|---|---|---|
| (එ) | 1995 ජූලි 12 දිනැති අංක එස්ඊ1/එ/4/34 දරන රජයේ ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශය | (i) චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සංස්ථාව ඉඩම් කල්බදු දීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද කල්බදු වටිනාකම, විශේෂ කමිටුවක් මගින් නැවත ඇගයීමට ලක්කර නොතිබුණි.<br><br>(ii) එමෙන්ම සංස්ථාව විසින් 2007 වර්ෂයේදී නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම වෙනුවෙන් සංස්ථාව සතු ඉඩමක් විකුණුම් ගිවිසුමක් මත පෞද්ගලික සමාගමකට ලබාදුන්නද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකල බැවින් එම ඉඩම නැවත සංස්ථාවට අත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඒ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය වෙත දීමනා ලෙස රු.මිලියන 40.95 ක් ගෙවා තිබුණි. |
| (ඔ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා සහ අදාල අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදි සංස්ථාවේ නිලධාරින් 21 දෙනෙකු වෙනුවෙන් රු. 2,656,637 ක් වටිනා ඉන්ධන ලීටර 24,560 ක් ලබා දී තිබුණි. |
| (ඕ) | 2013 ජූලි 08 දිනැති අංක අමප/13/0781/503/065 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක්වන පුද්ගලයින්ගේ ගොඩනැගිලි හා වෙනත් නිර්මිතයන් වෙනුවෙන් තක්සේරු මුදලින් සියයට 80 ක් අත්තිකාරම් මුදල් ගෙවීමට ප්‍රථම, එම පාර්ශවයන් සමග ගිවිසුම් වලට එළඹිය යුතු වුවද එලෙස ගිවිසුම්වලට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව ගෙවන ලද අත්තිකාරම් මුදල රු.මිලියන 76.72 ක් විය. |

## 2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් සංස්ථාව ලද රු.මිලියන 2,132.20 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානවලින් විධිමත් අනුමැතියකින් තොරව රු.මිලියන 547 ක් එනම් ප්‍රදාන වලින් සියයට 25 ක් සංස්ථාවේ පොදුකාර්ය වියදම් ලෙස ලබා ගෙන තිබුණි. එමෙන්ම මහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සංස්ථාව විසින් රු.මිලියන 28 ක සේවා ගාස්තුවක්ද අය කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි සංස්ථාව විසින් රු.83,025,000 ක් වටිනා පාවෙන වතුර ඉසින යන්ත්‍රයක් සහ ජංගම වතුර ඉසින යන්ත්‍ර දෙකක් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත මිලදි ගෙන තිබුනද එම මිලදි ගැනීමට පෙර එම යන්ත්‍රවල අවශ්‍යතාවය සහ යන්ත්‍ර භාවිතා කරන ස්ථාන මොනවාද යන්න පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණු අතර මිලදි ගැනීම සඳහා මහා භාණ්ඩාගාර අනුමැතියද ලබා ගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට මෙම යන්ත්‍ර භාවිතයට නොගෙන අනාරක්ෂිතව ගබඩා භූමියෙහි ගාල් කර තිබුණි.

(ඇ) මහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදි වේරස් ගඟ වැසි ජලය අපවහනය හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද මුළු වියදමින් සියයට 17 ක් එනම් රු. මිලියන 84.90 ක් ව්‍යාපෘතියේ කළමනාකරණ ගාස්තු ලෙස අයකර ගෙන තිබුණු අතර 2014 වර්ෂයේ සිට එලෙස අයකර ගත් මුළු කළමනාකරණ ගාස්තුව රු. මිලියන 313.14 ක් විය. මෙයට අමතර ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල වැටුප් ලෙස රු. මිලියන 111.35 ක්ද ව්‍යාපෘති අරමුදලින් ලබා ගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදි විධිමත් අනුමැතියකින් තොරව සංස්ථාව එක්සත් ජාතින්ගේ වෙසක් උත්සවය පවත්වන ලද නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක සිදුකළ වැඩි දියුණු කිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 11.20 ක් වැයකර තිබුණු අතර නාගරික සංවර්ධන අධිකාරියෙන් අය විය යුතු එම වටිනාකම ප්‍රතිපූර්ණය කිරීම එම අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ හා සංස්ථාවේ බදු පසු ලාභය පිළිවෙලින් රු.මිලියන 1,080.54 ක් හා රු.මිලියන 1,058.76 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය පිළිවෙලින් රු.මිලියන 1,221.28 ක් හා රු.මිලියන 1,193.99 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සමූහයේ හා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.මිලියන 140.74 ක හා රු.මිලියන 135.23 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සංස්ථාවේ පරිපාලන වියදම් රු.මිලියන 133.22 කින් හා ප්‍රවර්ධන වියදම් රු.මිලියන 108.52 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සහ 2014 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 103.89 ක හා රු. මිලියන 346.69 ක ලාභයක් පැවතියද 2015 වර්ෂයේදී රු.මිලියන 157.89 ක අලාභයක් ඇති වී තිබුණි. 2016 වර්ෂයේදී එය රු.මිලියන 1193.99 ක ලාභයක් බවට පත්ව තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ලාභය රු.මිලියන 1,058.76 ක් විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී සංස්ථාවේ දායකත්වය 2013 වර්ෂයේ සිට ධන අගයකින් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.මිලියන 1,681.06 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදි සංස්ථාවේ දළ ලාභ අනුපාතය සියයට 11 කින් වැඩි වුවද, සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ඉපයු ලාභය සියයට 0.5 කින් අඩුවී තිබුණු අතර වෙනත් මෙහෙයුම් ආදායම් ඉකුත් වර්ෂය හා සැසඳීමේදි සියයට 100 කින් වැඩිවී තිබුණද, පරිපාලන වියදම් ඇතුළුව අනෙකුත් මෙහෙයුම් වියදම් සියයට 30 කින් ඉහළ යාම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 14 ක්ව තිබුණි.

(ආ) ණයගැති පිරිවැටුම් අනුපාතය සහ ණය එකතු කර ගැනීමේ කාලය පෙර වර්ෂය සමග සැසඳීමේදි පහළ මට්ටමක විය. මෙම තත්ත්වය ණය කළමනාකරණ ක්‍රියාවලියේ දුර්වලතාවයක් ලෙස වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනතට අනුව, ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීම සහ එම ඉඩම්, ගොඩනැගිලි, කාර්මික, වාණිජ හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය තත්ත්වයට පත් කිරීම, එකී ඉඩම් වල භාරකාරත්වය කළමනාකරණය හා පාලනය, එම ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීමට යටත්ව භාරව සිටීම, ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉදිකිරීම් කටයුතු සහ උපදේශන පැවරුම් කාර්යය භාර ගැනීම, සහ ඇල මාර්ගවල භාරකාරත්වය, වැඩි දියුණු කිරීම, නඩත්තුව, පාලනය සහ ඇල මාර්ග දූෂණය වීමෙන් වලක්වා ගැනීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු සහ කාර්යයන් වේ. මෙකී අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

සංස්ථාව විසින් 2017-2021 වර්ෂ 04 ක කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර ඒ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථා පනත මඟින් පැවරී ඇති පහත සඳහන් කටයුතු ඉටුකිරීමට අදාල කාර්යයන් සංයුක්ත සැලැස්ම තුල ඇතුලත්ව නොතිබුණි.

(i) දිවයින පුරා පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම.

(ii) ඇල ඉවුරක ඇති යම් ඉඩම් ප්‍රදේශයක්, ඇල රක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන එම රක්ෂිත ප්‍රදේශය තුල තාවකාලික හෝ වෙනත් ඉදිකිරීම් වැළකෙන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම.

(ආ) සංයුක්ත සැලැස්ම තුළ හඳුනාගත් උපාය මාර්ග ලඟා කර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර හඳුන්වා දුන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) අනුව ප්‍රගතිය ඇගයීමට ලක්කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු.මිලියන 6,036 ක් වූ ව්‍යාපෘති සංයුක්ත සැලැස්ම තුළ ඇතුළත් කළද ඒවා මොනවාද යන්න කළමනාකරණය විසින් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ඈ) සංයුක්ත සැලැස්ම තුළ ඇතුළත් 2018 වර්ෂයේ සිට සංස්ථාව ක්‍රියාත්මක කළ යුතු වන සේවා යෝජක ව්‍යාපෘති (Own Project) මෙන්ම ඉදිකිරීම් ව්‍යාපෘති මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ඉ) සංයුක්ත සැලැස්මෙහි සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගත යුතු ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 658.17 ක් වෙන්කර තිබුණු අතර එය මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 10 ක් විය.

(ඊ) සංයුක්ත සැලැස්මෙහි ඇතුලත් සියලුම ක්‍රියාකාරකම්, සංස්ථා පනත් වගන්ති අංක 8 හා 9 යටතේ හඳුනාගෙන තිබුනද පනතේ අනෙකුත් වගන්ති යටතේ ඉටු කළ යුතු කාර්යයන් සඳහන්ව නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය මෙහෙයවීම යටතේ පාර්ලිමේන්තු සංකීර්ණයට බටහිර මායිමේ පිහිටි අක්කර 1000 ක පමණ වූ පහත් බිම් ප්‍රදේශ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ආරක්ෂා කර ගැනීමට සහ පාලනය කිරීමට ඒ පිළිබද විශේෂඥ ආයතනය වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට පවරා තිබුණි. එසේ පැවරුණු ඉඩම් වල අනවසර පදිංචිවීම් හා අනවසර ගොඩකිරීම් ඉවත් කිරීමේ සම්පූර්ණ වගකීම (Sole Responsibility) සංස්ථාවට පැවරී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් ඉඩම් අක්කර 62 ක් පමණ අනවසර පදිංචි කරුවන් විසින් අත්කරගෙන තිබීම හා තවත් අක්කර 79 ක් සංස්ථාව විසින් අවසතු කරනය (Divesting) කර තිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සංස්ථාවෙන් අපේක්ෂා කරන ලද කාර්යය ඉටුකිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි. ඉහත ප්‍රදේශ අහිමි වීමට සාපේක්ෂව වැසි ජලය පිටතට ගලායාමේ ධාරිතා (Out Fall Capacity) වැඩිකිරීමට සංස්ථාව ප්‍රමාණවත් පියවර නොගැනීම ජල ගැලීම් ඇතිවීමට සෘජුව බලපා තිබුණි. එමෙන්ම අනවසර පදිංචිකරුවන් පදිංචි ඉඩම්වල මායිම් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කටයුතු අවසන්ව නොතිබුණු අතර ලඟාකර ගත් භෞතික ප්‍රගතිය සියයට 50 ක් විය.

(ආ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව ජල රැඳවුම් ප්‍රදේශ තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් 1321 ක් හඳුනාගෙන තිබුණද එම හඳුනාගත් ඉදිකිරීම් ඉවත් කිරීමට අපොහොසත්ව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී නව ව්‍යාපාර යෝජනා ලෙස සංස්ථාවට අයත් කිරිමණ්ඩල මාවතේ සහ රාගම ඉඩම්වල නිවාස යෝජනා ක්‍රම 02 ක් ඉදිකිරීමට සංස්ථාවේ සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නිවාස ක්‍රම වලට අදාල සැලසුම් පිළියෙල කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදි සංස්ථාවට ලැබුණු කොන්ත්‍රාත් ප්‍රමාණයෙන් කොන්ත්‍රාත් 84 ක් එනම් මුළු කොන්ත්‍රාත් ගණනින් සියයට 70 ක් උප කොන්ත්‍රාත්කරුවන් මගින් ඉටුකර ගැනීම මත සංස්ථා පනතේ ප්‍රධාන අරමුණක් වන “ගොඩනැගිලි ඉංජිනේරු සහ ඉදිකරිම් වැඩ භාර ගැනීම සහ ඉදිකරිම් ක්ෂේත්‍රයේ තරගකාරි ආයතනයක් විම” යන අරමුණු ඉටු වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදි ඕලියමුල්ල ජල පොම්පාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සංස්ථාව රු. මිලියන 800 ක ප්‍රතිපාදන වෙන් කර තිබු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි මුල්‍ය ප්‍රගතිය රු. මිලියන 799.97 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) උක්ත ව්‍යාපෘතියට අවශ්‍ය ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් සහ නිවාස අහිමි වන්නන්ට නව නිවාස ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂයේදි සංස්ථාව රු. මිලියන 615 ක් නොගෙවා තිබු නමුත් මුල්‍ය ප්‍රගතිය තුළ එම වටිනාකම ගෙවු වටිනාකමක් ලෙස දක්වා තිබුණි.

(ii) ව්‍යාපෘතිය හේතුවෙන් ඉවත් කිරීමට යෝජිත පවුල් පිළිබඳව සංස්ථාව සකස් කරන ලද ලේඛනයන්හි ඇතුළත් ඇතැම් වන්දි ලාභීන්ගේ නිවාස වල වරිපනම් අංක, ඔවුන්ගේ නම් හා ලිපිනයන් සඳහන්ව නොතිබූ අතර ඇතැම් ලිපිනයන් දෙවරක් සඳහන්ව තිබීම හේතුවෙන් මෙම ලේඛනවල නිවැරදි බව විගණනයේදී ප්‍රශ්නකාරි විය.

(iii) එමෙන්ම ව්‍යාපෘතිය යටතේ සංස්ථාව පළමු අදියරේ හඳුනාගත් අහිමිවන නිවාස ගණන 201 ක් වුවද ඒ වෙනුවෙන් නිවාස 205 ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් වෙන්කර ගැනීම සඳහා සංස්ථාව ඉල්ලුම් කිරීම විගණනයේදී මතභේදාත්මක විය. තවද ව්‍යාපෘතිය යටතේ පවරා ගන්නා ඉඩම් සඳහා වන්දි ගෙවීමට හෝ නිවාස අහිමි වන්නන්ට නව නිවාස ලබාදීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගෙනද නොතිබුණි.

(iv) යථෝක්ත ව්‍යාපෘතියේ වියදම් ඇස්තමේන්තුවේ ඇතුළත් නොවූ සංස්ථාවේ පොදු කාර්ය වියදම් සඳහා රු.112,264,131 ක් එනම් මුළු පිරිවැයෙන් සියයට 17 ක් ලබා ගැනීමට සංස්ථාව අපේක්ෂා කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව රු. මිලියන 1,484.81 ක් වටිනා ව්‍යාපෘති 31 ක් සම්පූර්ණයෙන් නිම කිරීමට සැලසුම් කළද සමාලෝචිත වර්ෂය අවසානයට ඒවායේ භෞතික ප්‍රගතිය සියයට 9 ත් සියයට 75 ත් අතර පහළ මට්ටමක පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව රු.මිලියන776.42 ක ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුනද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් තොරව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ව්‍යාපෘති 26 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 903.54 ක් වැය කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉටු කිරීමට හඳුනාගත් ව්‍යාපෘති ගණන 46 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව රු. මිලියන 2,104 ක පිරිවැය වූ ව්‍යාපෘති 81 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර වැඩිපුර ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 40 ක් සඳහා ප්‍රතිපාදන වෙන් කළේ කෙසේද යන්න විගණනයට පැහැදිලි නොකෙරුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් පිටකෝට්ටේ 9 වන පටුමගේ පිහිටි අක්කර 05 ක් පමණ වූ ඉඩමෙහි සුපිරි නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සංවර්ධනකරුවකු සමඟ විකුණුම් ගිවිසුමක් ඇති කර ගෙන තිබූ අතර එය 2010 වර්ෂයේ නිම කළ යුතු විය. මෙම ඉඩම සංවර්ධනය කිරීම සඳහා සංවර්ධනකරුගෙන් රු.මිලියන 489 ක අත්තිකාරමක් ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට සංවර්ධනකරු කටයුතු කර නොතිබුණද අදාළ ගිවිසුම අවලංගු නොකිරීම හේතුවෙන් නැවත මෙම ඉඩම සුදුසු සංවර්ධනකරුවෙකුට පැවරීමට ඇති අවස්ථාව සංස්ථාවට අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සුදු නෙළුම් නිවාස ව්‍යාපෘතියේ නිවාස ලාභීන්ගෙන් ලැබිය යුතු හිඟ හිටි වාරික හා පොළී වටිනාකම රු. මිලියන 22.34 ක් අයකර ගැනීමට ගිවිසුම් ගත කොන්දේසි වලට අනුව සංස්ථාව විසින් කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණු අතර එම මුදලින් රු.මිලියන 21.88 ක් වෙනුවෙන් බොල්ණය ප්‍රතිපාදනයක්ද කර තිබුණි.

(ඈ) සංස්ථාව වෙත පැවරී ඇති කිත්තම්පහුව ඇල රක්ෂිතය තුල පිහිටි ඉඩම් කොටස් 05 ක් වාර්ෂිකව බදු කුලී පදනම මත බදු කරුවන්ට ලබාදී තිබුණද සංස්ථාව විසින් 2012 වර්ෂයේ සිට ඔවුන් සමග බදු ගිවිසුමකට එළඹ නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට අයකර නොගත් බදු කුලී ආදායම රු. 630,000 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ කතරගම හා නුවරඑළිය සංචාරක බංගලා වලින් රැස්කරගත් ආදායම රු.මිලියන 3.25 ක් වුවද ඒ වෙනුවෙන් දරන ලද වියදම රු.මිලියන 7.46 ක් වූයෙන් ලැබූ සමුච්චිත අලාභය රු.මිලියන 4.21 ක් විය.වියදමට සරිලන ගාස්තු ක්‍රමයක් හඳුනාගැනීමට කළමනාකරණය අපොහොසත්වීම මෙම තත්ත්වයට බලපා තිබුණි.

(ඉ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය මගින් 2014 වර්ෂයේදී සංස්ථාවට නීත්‍යානුකූලව පවරා තිබුණු ජීප් රථය නැවත එම ව්‍යාපෘතිය විසින් රැගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ලුනාව ව්‍යාපෘතිය යටතේ සංස්ථාවේ කටයුතු වෙනුවෙන් 2012 වර්ෂයේදී ලබාදුන් වාහන 02 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජල සම්පාදන අමාත්‍යාංශයේ ධාවන කටයුතු සඳහා යොදා ගෙන තිබුණද එම වාහන සංස්ථාවට නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) වර්තමානයේ සිදුවන අනවසර ඉඩම් ගොඩකිරීම් වලක්වාලීමට සංස්ථා පනතේ පවතින විධිවිධාන ප්‍රමාණවත් නොවන බැවින් එම වගන්ති නිවැරදි කර පනත සංශෝධනය සඳහා 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම පනතේ පවතින මෙවැනි අඩුපාඩු මත අනවසර ඉඩම් ගොඩකිරීම් සම්බන්ධව සංස්ථාවට ලැබෙන පැමිණිලි වෙනුවෙන් ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් ලබා ගැනීම වෙනුවෙන් රු. මිලියන 4,000 ක බැංකු ණය ලබා ගැනීමේ ව්‍යාපෘතිය ඇගයීමේදි (Project Appraisal), ඉදිරි වර්ෂ වල මුහුදු වැලි අලෙවිය පුරෝකථනයට නිශ්චිත ගැනුම්කරුවන් හා විකුණුම් ප්‍රමාණ හඳුනා ගැනීමකින් තොරව සංස්ථාවේ වර්තමාන අලෙවිය මත යම් ප්‍රතිශතයක් එකතු කිරීමෙන් පමණක් විකුණුම් ප්‍රමාණයන් ගණනය කර තිබුණි.
මෙම තත්ත්වය මත අපේක්ෂිත අලෙවිය ලබා ගැනීමට සංස්ථාව අපොහොසත් වුවහොත් ලබා ගත් ණය සහ එයට අදාළ පොලිය ආපසු ගෙවීම ගැටළු සහගත බව නිරීක්ෂණය විය. නිදසුනක් ලෙස, ව්‍යාපෘති ඇගයීම් ලේඛනය (Project Appraisal) අනුව 2018 වර්ෂය තුළ සෝදා හලන ලද (Washed and Sieved) වැලි කියුබ් 257,238 ක් අලෙවියෙන් රු. මිලියන 1,993.59 ක විකුණුම් ආදායමක් ලබා ගැනීමට පුරෝකථනය කර තිබුණද, 2018 අගෝස්තු 31 දින වන විටත් අලෙවි කරන ලද වැලි කියුබ් ගණන 33,435 ක් විය. තවද ලබාගත් ණය මුදල සංස්ථාවේ ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 87 ක ඉහළ අගයක් ගෙන තිබීම හේතුවෙන් මෙම තත්ත්වය සංස්ථාවේ ද්‍රවශීල වත්කම්වලට අහිතකර ලෙස බලපා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ කෙරවලපිටිය කසල අංගනයේ, කසල බැහැර කිරීමේ ආදායම රු.466,431,038 ක් වුවද ඉන් රු.355,098,116ක් එනම් ආදායමෙන් සියයට 76 ක් අය කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 28 දින සංස්ථාව සතු දෙහිවල, අත්තිඩියෙහි පිහිට පර්චස් 180 ක ඉඩම පෞද්ගලික සමාගමට බදු දීමේදි ඉඩමේ වර්තමාන වටිනාකම පිළිබඳ රජයේ තක්සේරුවක් ලබානොගෙන ඉකුත් වර්ෂයේ එයට යාබද ඉඩම් බදු දීමේදි සංස්ථාව ලබාගත් තක්සේරුව පදනම් කරගෙන මෙම ඉඩමද බදු දී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට අයත් කොළඹ 05, කිරිමණ්ඩල මාවතේ පිහිටි පර්චස් 31.91 ක ඉඩම බදු දීමේදී ලබාගත් රජයේ වාර්ෂික බදු තක්සේරුව රු.2,610,000 ක් වුවද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම රජයේ තක්සේරුව රු.326,250 ක් ලෙස අඩු කර බදුකරුගෙන් අය කිරීමට තීරණය කර තිබුණි. එමෙන්ම මෙම ඉඩම බදුකරු විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින සිටම භාවිතයට ගනු ලැබුවද 2018 සැප්තැම්බර් වන විටත් සංස්ථාව සමග නීත්‍යානුකූල ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව සිදු කරන ලද අබලි භාණ්ඩ අපහරණය කිරීමේ වෙන්දේසියේදී තක්සේරු වටිනාකම රු.1,460,000 ක් වූ භාණ්ඩ අයිතම 04 ක් සඳහා තෝරාගත් ගැණුම්කරුවන් ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම රු2,831,677 ක් වුවද ඔවුන් එම මිලට භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. වෙන්දේසි භාණ්ඩවල ස්වභාවය, වටිනාකම වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමකින් තොරව සියලුම අපහරණ භාණ්ඩ සඳහා තක්සේරු වටිනාකමින් සියයට 1 ක ආපසු ගෙවන තැන්පතුවක් ලබා ගැනීමට සංස්ථාව තීරණය කිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ සේවා අංශයෙන් අළුත්වැඩියා කටයුතු සිදුකර ගැනිම සඳහා යොමුකළ වාහන 20 ක සේවා කටයුතු සඳහා සත්‍ය වශයෙන් වැය වූ කාලය පැය 3 ත් පැය 10 ත් අතර පැවතියද එම වාහන නැවත භාරදීම සඳහා මාස 02 කට වැඩි කාලයක් ගතකර තිබීම විගණනයේදි ප්‍රශ්නකාරි විය. තවද සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසය තුළ සේවා අංශයේ සේවකයින් 25 දෙනෙකු වැඩ කළ කාලය, අතිකාල පැය 1302 ක් සමග මුළු පැය ගණන පැය 5343 ක් වුවද, එම මාසය තුළ සම්පූර්ණ කරන ලද වැඩ සඳහා සත්‍ය වශයෙන් ගතවූ කාලය පැය 1240 ක් වීම හේතුවෙන් එම මාසය තුළ සේවකයින්ගේ අක්‍රිය කාලය (Idle Time) පැය 4103 ක් විය. මෙම තත්ත්වය මත සංස්ථාවේ සේවා සහ නඩත්තු අංශයේ කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායීව කළමනාකරණය නොවන බව නිරීක්ෂණය විය.

(ග) ඉඩම් ගොඩකිරීම් සහ ඉදිකිරීම් කටයුතු සඳහා මුහුදු වැලි අලෙවි කිරීම සංස්ථාවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වුවද සංස්ථාව විසින් මුහුදු වැලි සම්බන්ධව යහපත් තොග කළමනාකරන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අලෙවිය සඳහා පැවති මුහුදු වැලි තොගය අවසන් වෙමින් පැවතියදී, ඒ බව කලින් හඳුනානොගෙන සමාලෝචිත වර්ෂයේදී මුහුදු වැලි ගොඩ දැමීම සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමට සංස්ථාව හදිසියේ මිල ගණන් කැඳවා තිබුණු අතර ලංසු භාරදීම සඳහා 2017 මැයි 30 සිට 2017 අගෝස්තු 30 දක්වා මාස 03 ක කාලයක් ලබාදී තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන්ගේ 04 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර සංස්ථාවේ පවතින වැලි තොගය අවසන් වෙමින් පවතින බැවින් සහ කඩිනමින් නැවත වැලි ලබා ගත යුතු බැවින් අවම ලංසුකරුගේ සුදුසුකම් වැඩි දුර ඇගයීමට ප්‍රමාණවත් කාලයක් ගත කිරීමට සංස්ථාවට නොහැකි වීම මත එම ලංසුකරු ප්‍රසම්පාදනයෙන් ඉවත් කර තිබුණු අතර දෙවන ලංසුකරු ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබුණි. මෙලෙස අවම ලංසුකරු ඉවත් කිරීම මත සංස්ථාවට සිදුවූ පාඩුව ඇමරිකානු ඩොලර් 800,000 ක් විය.

තවද මුහුදු වැලි ලබාගත් සැනින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා භාවිතා කිරීමට නොහැකි වීම හේතුවෙන් එම වැලි සෝදා අලෙවි කිරීමට සංස්ථාව කටයුතු කර තිබුණු අතර 2018 වර්ෂයේ අගෝස්තු වන විට ගොඩ දමන ලද මුහුදු වැලි ප්‍රමාණය කියුබ් 185,552ක් වුවද සෝදා අලෙවි කරන ලද මුහුදු වැලි ප්‍රමාණය කියුබ් 45,973 ක් පමණක් විය. මෙම කාර්යය කෙතරම් ප්‍රායෝගිකව සහ ලාභදායීව සිදු කළ හැකිද යන්න විගණනයේදි ප්‍රශ්නකාරි විය.

(ච) ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය ඇගයීම සඳහා සංස්ථාව නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කිරීමට සංස්ථා කළමණාකරණය අපොහොසත් වූ අතර ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය පමණක් විගණනයට ඉදිරිපත් කෙරුණි.

එමෙන්ම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිළිබඳ නිසි අවබෝධයකින් තොරව මූල්‍ය ප්‍රගතිය පමණක් සැලකිල්ලට ගෙන සංස්ථාව ව්‍යාපෘති කළමණාකරනය කරන්නේ කෙසේද යන්න විගණනයේදී ප්‍රශ්නකාරී විය. මෙවැනි තත්ත්වයක් මත සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වැඩි ගණනක භෞතික කාර්ය සාධනය පහළ මට්ටමක පැවතුණි.

(ජ) සංස්ථාව සතු බෙල්ලන්විල පැවැති වෙළඳ කුටි 04 ක් සමාලෝචිත වර්ෂයේ මැයි සිට කුලීපදනම මත ලබා දීමට කටයුතු කිරීමකින් තොරව වසා දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වෙළඳ කුටි වෙනුවෙන් අය විය යුතු හිඟ හිටි බදු කුලිය රු.717,623 ක් විය. සංස්ථාව බදුකරුවන් සමග විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව වෙළඳ කුටි බදු දීම හේතුවෙන් මෙම මුදල අය කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ යන්ත්‍ර හා උපකරණ අංශයට අයත් බර වාහන (Heavy Vehicles) 95 ක වැඩ කළ හැකිව තිබූ මුළු පැය ගණන 162,000 ක් වුවද සත්‍ය වශයෙන් වැඩ කර තිබූ පැය ගණන 116,328ක් වුයෙන් යන්ත්‍ර පැය 45,672 ක් අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය. තවද යන්ත්‍රවල අක්‍රිය කාලය ඵලදායිව යොදා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී මෙම යන්ත්‍ර කුලී පදනම මත ලබා දීමෙන් සංස්ථාවට ලැබුණු ආදායම රු.13,996,352 ක පහළ අගයක් විය.

(ඩ) දියත උයන දුම්රිය ආපන ශාලාවේ තිබූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 10 ක් වොටර්ස් ඒජ් සමාගම විසින් විධිමත් දැනුම් දීමකින් තොරව ඉවත් කර ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම භාණ්ඩ නැවත සංස්ථාවට ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ප) මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංස්ථාවට පැවරුණු ඉඩම් හෙක්ටයාර 378 ක් 1996 අගෝස්තු 15 දිනැති අංක 96/1760/111/125 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කෙටිකාලීන බදු පදනම මත ලබාදීමට සංස්ථාව කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂ 20 කට වැඩි කාලයක සිට සංස්ථාවට රැස්කර ගත හැකිව තිබූ බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි.

(බ) දියත උයන දුම්රිය ආපනශාලාව බදු පදනම මත ලබාදීම සඳහා සංස්ථාව මිල ගණන් කැඳවා තිබුණද සමාලෝචිත වර්ෂයේදී එය බදු පදනම මත ලබාදීමට කටයුතු නොකිරීම හේතුවෙන් සංස්ථාවට අහිමි වූ ආදායම රු. මිලියන 12.12 ක් විය.

(ම) සංස්ථාව විසින් බාහිර පාර්ශවයන් වෙත යන්ත්‍ර උපකරණ කුලියට ලබාදීමේදී දිනකට අවම වශයෙන් පැය 04 ක කාලයක් සඳහා ගාස්තු අයකළ යුතු වුවද අවස්ථා 07 කදී සංස්ථාව ලබාදුන් යන්ත්‍ර වෙනුවෙන් එලෙස ගාස්තු අය නොකිරීම හේතුවෙන් සංස්ථාවට අහිමි වූ ආදායම රු.205,400 ක් විය.

(න) සංස්ථාව නව ව්‍යාපාරික අවස්ථා ලෙස මුහුදු වැලි ගොඩදමා සෝදා (Washed and Seived ) අලෙවි කිරීමට සහ මධ්‍යම පාන්තිකයින් සඳහා රාගම ප්‍රදේශයේ නිවාස 400 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කළද මෙම ව්‍යාපෘතිවල සාර්ථකභාවය පිළිබඳ කාලීනව වෙළඳ පොළ සමීක්ෂණයක් (Market Survey) සිදු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂවලදී සංස්ථාව පිහිටුවීමේ මූලික අරමුණුවලින් බැහැරව මහා භාණ්ඩාගාර ප්‍රදාන මත වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට, මුහුදු වැලි විකිණීමට සහ සංස්ථා ඉඩම් විකිණීමට මෙන්ම දිගු කාලීන බදු ලබා දීම මත ආදායම් ඉපයීමට කටයුතු කර තිබුණු අතර පසුගිය වර්ෂ 5 තුළදී මෙම ආදායම් ප්‍රභවයන්ගෙන් සංස්ථාව උපයන ලද ආදායම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 50 ත් සියයට 81 ත් අතර විය.
මෙම තත්ත්වය මත සංස්ථාව මගින් සමාජයට ඉටු විය යුතු පහත් බිම් හඳුනාගෙන ප්‍රකාශයට පත්කිරීම පළාත් 05 කට පමණක් සීමා වී තිබුණු අතර ජාතික මට්ටමින් මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් සිදුවන සංවර්ධන කාර්යයන් හේතුවෙන් සිදුවන භූමි පරිහරන රටාවේ වෙනස්වීම් මත ස්වභාවිකව ගලායන වැසි ජල මාර්ග වලට සහ පරිසරයට වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම, අවිධිමත් නාගරීකරණය හේතුවෙන් සිදුවන වැසිජල ගැලීම් අවමකර පාලනය කිරීමට අවශ්‍ය සැලසුම පිළියෙල කිරීම වැනි කාර්යයන් අවම වශයෙන් ඉටු වී තිබුණි. තවද ඉහත සැලසුම් පිළියෙල කිරීමට අවශ්‍ය දත්තයන් වන ඇල මාර්ගවල ජල මට්ටම්, ජලය ගලායාමේ ධාරිතාව, වර්ෂාපතන රටාව යනාදී දත්ත රැස් කිරීමට සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු අතර මෙම දත්ත රැස් කිරීම වෙනුවෙන් වාර්ෂිකව මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගෙනද තිබුණි.
එමෙන්ම 2003 වර්ෂයේදී ජයිකා (JICA) ආයතනය විසින් සංස්ථාවට ලබා දුන්, කොළඹ නගරය සහ ඊට තදාසන්න ප්‍රදේශවල ස්ථාපිත කර තිබූ ජල මාපක සහ වර්ෂාපතන මාන පවත්වාගෙන යාමටද සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී අපහරණය කිරීමට හඳුනාගත් භාණ්ඩ හා උපකරණ අයිතම 100 කින් අයිතම 19 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපහරණය කිරීමෙන් තොරව ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් මහා භාණ්ඩාගාර ප්‍රදාන මත රු. මිලියන 64.72ක් වටිනා ගේබියන් පෙට්ටි 10,600ක් මිලදී ගෙන තිබුණද, සංස්ථාව ගේබියන් බැම් බැඳීම උප-කොන්ත්‍රාත්කරුවන් මගින් සිදුකර ගන්නා බැවින් මෙලෙස ගේබියන් පෙට්ටි විශාල ප්‍රමාණයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය විගණනයට පැහැදිලි නොකෙරුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට භාවිතයට නොගත් ගේබියන් පෙට්ටි ගණන 8,074 ක් වූ අතර එය මිලදී ගත් ප්‍රමාණයෙන් සියයට 76 ක් විය.

(ඈ) 1981 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුල සංස්ථාව විසින් පවරා ගත් ඉඩම්වලට අදාල වන්දි මුදල් කාලීනව ගෙවීමට කටයුතු නොකිරීම නිසා එම ඉඩම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි මුදල රු. මිලියන 62.25 ක් වූ අතර ඊට අදාළව ගෙවිය යුතු පොළිය රු. මිලියන 106.90 ක් හෙවත් ගෙවිය යුතු වන්දි මුදල මෙන් සියයට 172 ක් විය. අදාල වන්දි ගෙවීමේ කාර්යය කඩිනම් කර පොළී ගෙවීම අවම කර ගත හැකි අයුරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා නොගැනීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. එමෙන්ම ඉඩම් පවරා ගැනීම සඳහා අවුරුදු 12 සිට අවුරුදු 36 දක්වා කාල පරාසයක් ගතවී තිබීම හේතුවෙන් මෙම ඉඩම් වල අනවසර පදිංචිකරුවන් සිටින බවද වැඩි දුරටත් අනාවරණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ අධීක්ෂණය හා පාලනය යටතේ පවතින අක්කර 40 ක ජල රැඳවුම් ප්‍රදේශ තුළ පදිංචිවී සිටි අනවසර පවුල් 464 ක පදිංචිකරුවන්ගේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් ජල රැඳවුම් ප්‍රදේශ අපවිත්‍රවීමට මෙන්ම ගොඩවීමටද ලක්ව තිබුණු අතර මෙම ඉඩම්වල මායිම් නිශ්චිතව දැක්වීම සඳහා මායිම් කණු සිටුවා නොතිබීම සහ සිටවූ

මායිම් කණුවලට නිසි ආරක්ෂාවක් හා පසු විපරම් කිරීමක් සංස්ථාව විසින් සිදුකර නොතිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

(ඊ) ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී විවිධ පාර්ශවයන් සංස්ථාවට ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍ර ගණන 515 ක් වුවද ඉන් අයදුම්පත්‍ර 307 ක් තාක්ෂණික කමිටුවට යොමුකර තිබුණු අතර ඒවායින් අයදුම් පත්‍ර 41 ක් සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණි.

(උ) මහකොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස වෙන්කර තැබීමට සංස්ථාව විසින් පවරාගත් නාවල - හීන් ඇල ජල රක්ෂිත ප්‍රදේශ තුල පැවති හෙක්ටයාර 02 ක භූමි ප්‍රමාණයක රු. මිලියන 161.23 ක් වැය කර සංස්ථාව විසින් ක්‍රිකට් ක්‍රීඩාංගනයක් ඉදිකර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ක්‍රීඩාංගනය භාවිතයට ගෙන නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අරමුණුවලට පටහැනිව 2014 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටපු දේශපාලකයකුගේ අනුස්මරණ කෞතුකාගාරයක් සහිත ස්මාරකයක් එම දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීම වෙනුවෙන් සංස්ථාවට අයවිය යුතු රු.මිලියන 31.31 ක මුදල අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ජනප්‍රිය ශිල්පීන්ගේ විවිධ ප්‍රසංග පැවැත්වීම මඟින් රැස්කර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එලෙස මුදල් රැස්කර ගෙන නොතිබුණි. තවද ඉදිකිරීමේ ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් සංස්ථාව විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවට රු.මිලියන 25 ක අත්තිකාරම් මුදලක් ගෙවා ද්‍රව්‍ය මිලදීගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අත්තිකාරම් මුදල පියවා නොතිබුණි.

(ආ) උප කොන්ත්‍රාත්කරුවන්ගේ කළවැඩ සහතික කිරීමකින් තොරව හා මැනුම්පත්‍ර ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් විසින් කරන ලද ඉල්ලීම් මත වේරස්ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 29.18 ක් ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ දියත උයන දුම්රිය ආපන ශාලාව සහ පබ් (Pub) ශාලාව සංවර්ධනය කිරීම හා වෝටස් ඒජ් සමාගමට පැවරීමේ කටයුතු සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආපන ශාලාව හා පබ් ශාලාව සංවර්ධනය කිරීම වෙනුවෙන් සංස්ථාව විසින් දරන ලද සංවර්ධන වියදම වූ රු. මිලියන 125.44 ක් අයකර ගැනීමට 2017 ජනවාරි 17 සමාගම සමග එකග වී තිබුණද එම සංවර්ධන වියදම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. මිලියන 37.02 ක් අඩු කර, සමාගම ගෙවිය යුතු වටිනාකම රු. මිලියන 88.42ක් ලෙසට පසුව සංශෝධනය කිරීම විගණනයේදි ගැටළු සහගත විය.

(ii) එලෙස සංස්ථාවට ගෙවිය යුතු රු. මිලියන 88.42 ක වටිනාකම වර්ෂ 05 ක් තුළ වාරික 05 කින් ගෙවා අවසන් කිරීමට සමාගම එකග වී තිබුණද, සමාලෝචිත වර්ෂයේදි සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 20 ක මූලික ගාස්තුව (Down Payment) සහ 2018 ජූලි 15 අයවිය යුතු රු. මිලියන 20.41 ක පළමු වාරිකය

වශයෙන් එකතුව රු.මිලියන 40.41 ක් 2018 අගෝස්තු 31 දින වන විටත් අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(iii) යථෝක්ත පැවරීමට අදාල ගිවිසුම හෝ පැවරීමට අදාළ ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ කෙරවල පිටිය කුණු අංගනයට රජයේ පළාත් පාලන ආයතන කසල බැහැර කිරීම මත එම ආයතනවලින් සංස්ථාවට ලැබිය යුතු රු.102,382,458 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු.72,475,016 ක් අඩමාණ ණය වෙන් කර තිබුණද එයට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි. තවද රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීම මත සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට අය විය යුතු රු.730,540 ක් සඳහා සම්පූර්ණයෙන්ම අඩමාන ණය ප්‍රතිපාදනය කර තිබුණි.

(ඉ) සංස්ථාව විසින් මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් ලබා ගැනීම සඳහා විදේශිය සමාගමක් සමග ඇ.ඩො. 19,975,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවකට එකඟ වුවද ඒ වෙනුවෙන් පාර්ශවයන් අතර විධිමත් ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අවබෝධතා ගිවිසුමක් (MOU) පමණක් ඇතිකර ගෙන තිබුණි. අවබෝධතා ගිවිසුමේ 4 වන වගන්තිය අනුව, කොන්ත්‍රාත්කරුට සවලීකරණ අත්තිකාරම් ගෙවිය හැකි වන්නේ විධිමත් ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව වුවද එයට පටහැනිව සංස්ථාව 2018 සැප්තැම්බර් 15 දින වන විට කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමෙන් තොරව අත්තිකාරම් වශයෙන් ඇ.ඩොලර් 994,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. තවද ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ කොන්ත්‍රාත්කරු 2018 ජනවාරි 20 දින සිට 2018 ඔක්තෝබර් 15 දින දක්වා මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 1 ක් සැපයිය යුතු වුවද 2018 සැප්තැම්බර් 15 දින වන විට සපයා තිබූ වැලි කියුබික් මීටර් ගණන 525,114 ක් වූ අතර එම ප්‍රමාණය ගිවිසුම්ගත ප්‍රමාණයෙන් සියයට 52 ක් පමණ විය.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

-------------------

සංස්ථාව විසින් හෝටල් සමාගමකින් ලබාගෙන තිබුණු සේවාවන් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු රු.1,568,248 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබූ අතර ලබා ගන්නා ලද සේවාවන්වල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.6 අරමුදල් උපයෝජනය

--------------------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට රාගම කළු ඔය ව්‍යාපෘතිය සහ හම්බන්තොට මයුරපුර ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු. මිලියන 56.50 ක ප්‍රතිපාදන අදාළ ව්‍යාපෘති වෙනුවෙන් භාවිතා කර නොතිබුණි.

## 4.7 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දියත උයන පරිශ්‍රය සඳහා 2014 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.මිලියන 2.58 ක් වටිනා එළවළු තැටි 100 ක් භාවිතයට නොගෙන මිලදී ගත් දින සිට ප්‍රධාන ගබඩා භූමියේ දිරාපත්ව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 50.97 ක් වටිනා ගේබියන් පෙට්ටි 8074 ක් සහ රු. මිලියන 24.05 ක් වටිනා බෝට්ටු 04 ක් සහ එක්ස්කැවේටර් යන්ත්‍රයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාවේ සෙමින් සංචලනය වන තොගයේ (Slow Moving Stock) වටිනාකම රු. මිලියන 267.32 ක් වූ අතර එයින් වසර 4 ක ටත් වඩා පැරණි තොගයේ වටිනාකම රු. මිලියන 48.49 ක් විය. මෙයින්ද වර්ග 8 කට අයත් රු. මිලියන 10.30 ක් වටිනා භාණ්ඩ හා උපකරණ සංචලනය වීමකින් තොරව (Non Moving) මධ්‍යම ගබඩාවේ රඳවා තිබුණි.

**4.8 ආර්ථික නොවූ ගනුදෙනු**

**----------------------------**

සංස්ථාව සතු, කැළණිය මුදුන් ඇළ පිහිටි අක්කර 05 රූඩ් 03 පර්චස් 9.77 ක ඉඩම් සමාලෝචිත වර්ෂයේදී කැළණිය විශ්වවිද්‍යාලයට රු. 415,075,892 කට විකුණා තිබුණද එම විකුණුම් වටිනාකම ඉඩමේ වර්තමාන තක්සේරු වටිනාකමට ලබා නොගෙන 2012 වර්ෂයේ ලබාගත් තක්සේරුවක් මත තීරණය කර තිබුණි.

**4.9 හඳුනා ගන්නා ලද පාඩු**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ත්‍රෛ භාෂා පාසැල් ව්‍යාපෘතිය සඳහා බොරළු පස් ලබා ගැනීමේදී සංස්ථාව එකඟ වූ පස් කියුබයක අවම මිල වූ රු.1,675 ක් වුවද පස් කියුබයක් රු.2,075 බැගින් මිලදී ගැනීම හේතුවෙන් සිදු වූ පාඩුව රු. මිලියන 04 ක් විය.

(ආ) කිරිමණ්ඩල මාවතේ පිහිටි සංස්ථාව සතු ගොඩනැගිල්ල සංස්ථාව විසින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමට 2003 වර්ෂයේ සිට බදුදීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් තක්සේරු බදු කුලියට වඩා අඩු මුදලක් අය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට සිදුවූ සමුච්චිත පාඩුව රු. මිලියන 2.5 ක් විය. එමෙන්ම මෙම මාසික බදු කුලිය 2005 වර්ෂයෙන් පසුව සංශෝධනය කිරීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

**4.10 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

**--------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් මුතුරාජවෙල ගුණසේකර මාවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළ ඉඩම පවරා ගැනීමට ප්‍රථම 1997 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.17,439,977 ක් වැය කර තිබුණද යථෝක්ත ඉඩම ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් පවරා ගැනීමට නොහැකි වීම මත එම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. තවද දරන ලද වියදම සමාලෝචිත වර්ෂයේ අලාභයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සංස්ථාව විසින් මූලික ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මාදින්නාගොඩ අතුරු ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 111 ක් වැය කර තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව ඉඩම් අත්පත් කර ගැනීමට සංස්ථාව කටයුතු කිරීම හේතුවෙන් ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් මත මෙම ඉදිකිරීම් අතර මග නවතා තිබුණි. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

**4.11 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සංස්ථාවේ සම්පත්**

---------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයේ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ කාර්ය මණ්ඩලයෙන් 04 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන වෙත මුදා හැර තිබූ අතර ඔවුන්ගේ වැටුප් හා දීමනා ලෙස සංස්ථාව රු.මිලියන 1.82 ක් වැයකර තිබුණි. එසේම සංස්ථාව සතු වාහනයක් රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම් වෙත නිදහස් කර තිබූ අතර එහි නඩත්තු වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.697,631 ක් වැය කර තිබුණද එම මුදල ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

## 4.12 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,873 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,448 ක් වීමෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ 462 ක පුරප්පාඩු හා අතිරික්ත 37 ක් විය. එම පුරප්පාඩු අතර සංස්ථාවේ ප්‍රධාන විධායක තනතුර වන සාමාන්‍යාධිකාරි තනතුර පුරප්පාඩුව පැවැති අතර 2018 සැප්තැම්බර් වන විටත් එම පුරප්පාඩුව පිරවීමට සංස්ථාව කටයුතු කර නොතිබුණු අතර මෙම තත්ත්වය සංස්ථාවේ කාර්යසාධනයට බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ පරිපාලිත සමාගම් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් හා එල් ආර් ඩී සී සේවා සමාගමෙන් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංස්ථාවට බඳවාගත් කාර්ය මණ්ඩලය පිළිවෙලින් 109 ක් සහ 800 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය වෙනුවෙන් සංස්ථාව සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් වශයෙන් ගෙවන ලද වටිනාකම රු.මිලියන 173.64 ක් විය. එසේ වුවද මෙම වියදම් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කරද නොතිබුණි. කෙසේ වෙතත් මෙම සේවකයින්ද ඇතුලත්ව කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. තවද උක්ත සඳහන් කාර්ය මණ්ඩලයට අමතර සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් සිය වැඩ බිම්වල කටයුතු සඳහා දිනකට රු.750 ක දීමනාවක් යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සේවකයින් 137 දෙනෙකුගේ සේවයද ලබාගෙන තිබුණි.

## 4.13 වාහන උපයෝජනය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ වාහන 61 ක් ප්‍රවාහන අංශභාර නිලධාරියාගේ අධීක්ෂණයකින් තොරව එක් එක් අංශවල ධාවනයට යොදාගෙන තිබූ අතර ඇතැම් වාහන ප්‍රමාණවත් ධාවනයක් සිදු කර නොතිබුණි. එසේ පැවතියදී සංස්ථාවේ ධාවන කටයුතු වෙනුවෙන් කුලී වාහන 36 ක් යොදාගෙන ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10.76 ක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාව සිදු කළ වත්කම් සංස්ථාපනයට අනුව වත්කම් ලේඛනයේ සඳහන් ට්‍රැක්ටර් ට්‍රේලරයක් භෞතික නිරීක්ෂණය වී නොමැති අතර වත්කම් ලේඛනයේ සඳහන්ව නොමැති වතුර බවුසරයක් භෞතිකව හඳුනාගෙන තිබුණි. මේ පිළිබඳ විධිමත් සොයාබැලීමක් 2018 අගෝස්තු වන විටත් සංස්ථාව විසින් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට අයත් ටිපර් රථ 09 ක් සහ කැබ් රථ 8 ක් සංස්ථාවේ සේවා අංශය මගින් අළුත්වැඩියා කිරීම සඳහා පිළිවෙලින් රු.4,525,312 ක් හා රු.2,946,604 ක් වැය කර තිබුණු අතර වර්ෂයේ සෑම මසකම එම රථවාහන නැවත නැවත අළුත්වැඩියා කර තිබීම

හේතුවෙන් සේවා අංශයේ රථ වාහන අළුත්වැඩියා කටයුතුවල ගුණත්වය පිළිබඳ විගණනයේදී ගැටළුකාරී විය.

## 4.14 වෙළඳ පොළ කොටස

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් වෙළඳපලේ පැවති රු. මිලියන 610 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක් සඳහා පමණක් තරගකාරී ලෙස ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ඉන් රු. මිලියන 31 ක කොන්ත්‍රාත්තුවක් පමණක් ලබාගෙන තිබුණි. මෙම තත්ත්වය අනුව සංස්ථාව විවෘත වෙළඳපලේ පවතින තරගකාරී කොන්ත්‍රාත් ලබා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුනු අතර මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ලැබෙන කොන්ත්‍රාත් කටයුතු පමණක් ඉටු කිරීම තුළින් සංස්ථාවට ලබා ගත හැකිව තිබූ වෙළඳපල කොටස අහිමි වී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “ න්‍යාය පත්‍රය” අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවද සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන මාස 4 ½ ක් ප්‍රමාද වීමෙන් පසු එනම් 2018 ජූලි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 6.2 අභ්‍යන්තර විගණනය

කළමනාකරණය විසින් නිවැරදි කළ යුතු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මඟ පෙන්වීම් සඳහා වැදගත් ක්‍රියාවලියක් ලෙස අභ්‍යන්තර විගණනය යොදා ගත යුතු වුවත් මහා පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු ලෙස සහ සංස්ථාවේ ව්‍යාපාරික කාර්යයන් වන ඉඩම් අලෙවිය හා බදු දීම, වැලි අලෙවිය සහ නිවාස ක්‍රම ඉදිකර අලෙවි කිරීමේ අවස්ථා පුළුල් වීමත් සමඟ යහපත් ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය බලගැන්වීමට සංස්ථාව විසින් නිසි අවධානයක් යොමු කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණන වැඩසටහන් තුළ සංස්ථාවේ කාර්යසාධනය ඇගයීමට අදාල වැඩසටහන් අන්තර්ගතව නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-------------------------------------------

### 6.3.1 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂ 03 කට අදාල (2017-2020) ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඇතුලත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණු අතර පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම තුලින් ප්‍රසම්පාදනයන්ට අදාළ උප ක්‍රියාකාරකම් (Procurement Activities) එම ක්‍රියාකාරකමට අදාල ඇස්තමේන්තුගත වටිනාකම හා එම වටිනාකමට අදාලව පත්කල යුතු ප්‍රසම්පාදන කමිටුව කුමක්ද යන්න හා ප්‍රසම්පාදනයන්ට අදාල නිවැරදි කාල රාමුවක්ද නිරූපණය නොවීය. තවද රජයේ ප්‍රදාන සඳහා පමණක් එම සැලැස්ම සකස්කර තිබූ අතර සංස්ථාවේ ව්‍යාපෘති හා සේවාදායක ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු එහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 64.72 ක් වටිනා ගේබියන් පෙට්ටි මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී ලබා ගත් අවම මිල ලංසුව හා දෙවන මිල ලංසුව අතර මිල වෙනස රු.172,250 ක් වුවද ලංසුකරුවන් එම භාණ්ඩ සඳහා ලබා දුන් වගකීමේ කාලය පිළිවෙලින් වර්ෂ 01 සහ වර්ෂ 10ක් විය. නමුත් සංස්ථාව ලංසුකරුවන් ඉදිරිපත් කළ වගකීම් කාලය සැලකිල්ලට නොගෙන අවම මිල ඉදිරිපත් කළ සමාගමට සැපයුම ලබා දී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කඳුරුවෙල වැඩ බිම සඳහා සංස්ථාව විසින් රු. මිලියන 34.40ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා අතිරේක 33 පරිදි විවෘත තරඟකාරී මිල ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමකින් තොරව ප්‍රාදේශීය සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් පමණක් (Mobile Tendering) මිල ගණන් ලබාගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව සිය වැඩ බිම් සඳහා අවශ්‍ය බොරළු පස් ප්‍රමාණය ව්‍යාපෘති ආරම්භයේදී නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර හදිසි අවශ්‍යතාවක් ලෙස වර්ෂය පුරාම විවිධ ප්‍රමාණයන්ගෙන් හා විවිධ මිල ගණන් යටතේ කොන්ත්‍රාත් 26 ක් සඳහා රු.මිලියන 415.81 ක් වැයකර බොරළු පස් ලබා ගෙන තිබුණි. මෙම තත්ත්වය කොන්ත්‍රාත් කළමනාකරණයේ දුර්වලතාවක් ලෙස නිරීක්ෂණය වන අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියකින්, රජය අපේක්ෂා කරන ආර්ථික බව, කාලීන බව හා ඉහල ගුණත්වයෙන් යුතු සැපයුම්කරුවකු තෝරා ගැනීමේ අවකාශ මේ තුළින් සීමා වී තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 සහ 5.4.10 වගන්ති අනුව කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වන විට හා කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝනය කළ හොත් සංස්ථාවට සිදුවන හානි අවම කර ගැනීමට කාර්යසාධන සුරක්ෂණයක් (Performance Bond) ලබා ගත යුතු වුවත් බොරළු පස් සැපයීම වෙනුවෙන් එලෙස සුරක්ෂණයක් ලබාගැනීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාව විසින් ටිපර් රථ කුලී පදනම මත ලබා ගැනීමේදී සමාලෝචිත වර්ෂය සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව ඉකුත් වර්ෂයේ ලබාගත් මිල ගණන් මත ටිපර් රථ කුලී පදනමට ලබාගෙන තිබුණි. මෙම තත්ත්වය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) වගන්තියට පටහැනි විය.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් කුලී වාහන ලබාගැනීමේදී වර්ෂය ආරම්භයේ මිල ගණන් කැඳවා කුලී වාහන සැපයුම්කරුවන් හා කුලී වාහන මිල ගණන් තීරණය කර තිබූ අතර කුලී ගිවිසුම් අළුත් කිරීමේදී නැවත තරඟකාරී මිල කැඳවීමකින් තොරව කලින් තීරණය කල මිලටම කුලී වාහන ලබාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දරන ලද වියදම රු.මිලියන 10.76 ක් විය.

(උ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී ලිඛිත ගිවිසුම්වලට එළඹීමකින් තොරව සංස්ථාව විසින් රු.මිලියන 37.97 ක් වටිනා කොන්ත්‍රාත් 04ක් කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කර තිබුණි.

(ඌ) සංස්ථාවේ සියළුම ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වෙනම සැපයුම් අංශයක් ස්ථාපිත කර තිබියදී එම අංශයේ අනුදැනුමකින් තොරව සමාලෝචිත වර්ෂයේ වේරස් ගඟ වැසි ජලය අපවහනය හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 124.59 ක් වටිනා ප්‍රසම්පාදන වැඩ 08, ක් සිදුකර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකිරීම් සාර්ථකව ඉටු නොකළ උප කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුගේ කාර්ය සාධන බැඳුම්කරයෙන් රු.1,995,075 ක් සංස්ථාව නැවත අයකරගෙන තිබුනද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.6 (අ) වගන්තිය ප්‍රකාරව එම කොන්ත්‍රාත්කරුවන් අසාධු ලේඛනගත කර නොතිබුණි.

(ඒ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) වගන්තිය අනුව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී කොන්ත්‍රාත්කරුගෙන් කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 5 කට නොඅඩු මුදලක් කාර්ය සාධන සුරක්ෂණයක් ලෙස ලබා ගත යුතු වුවත් සංස්ථාව විසින් එලෙස කටයුතු නොකර කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී, කාර්යසාධන සුරක්ෂණය සඳහා බිල්පත් වටිනාකමින් කොටසක් අයකර ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එලෙස අයකර ගත් වටිනාකම රු. 39,265,196 ක් විය. තවද සමාලෝචිත වර්ෂය අවසානයට එම වටිනාකමින් වර්ෂ 1ත් වර්ෂ 5ත් අතර නිරවුල් නොවූ ශේෂය රු.13,491,070 ක් වූ අතර වර්ෂ 5ට වැඩි ශේෂය රු.487,313 ක් විය.

### 6.3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට දියත උයන ඉදිකිරීමේ වැඩ කටයුතු නිමකළ යුතු දිනය වසර තුනකින් ඉක්ම වී තිබුණ ද එහි කටයුතු අවසන්ව නොතිබුණු අතර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 52.97 ක් හෙවත් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 43 ක් පමණ විය.

(ආ) කොලොන්නාව හා සාලමුල්ල ප්‍රදේශවල නිවාස 792 ක් ඉදිකිරීමේ (ගොඩනැගිලි බී සහ සී) කොන්ත්‍රාත්තුව සඳහා සංස්ථාව විසින් වැය කරන ලද වටිනාකම රු. මිලියන 653.02 ක් වුවද නාගරික සංවර්ධන අධිකාරිය විසින් සහතික කරන ලද වටිනාකම රු.මිලියන 355.69 ක් වූයෙන් ඉතිරි කළ වැඩ වටිනාකම වූ රු.මිලියන 297.33 ක් වසර තුනකට වැඩි කාලයක් ගත වුවද සංස්ථාව වෙත ලැබී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වැඩ අවසන් කළ යුතු රු. මිලියන 340 ක් වටිනා කොන්ත්‍රාත් 04 ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රගතිය සියයට 1 ත් සියයට 24 ත් අතර පහළ අගයක පැවතුණි.

(ඇ) සංස්ථාව නිසි මූලික අධ්‍යයනයකින් හා සැලසුමකින් තොරව බොල්ගොඩ ඇලෙහි ඉවුරු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එම ඇල ඉවුරු කඩා වැටීම නිසා ව්‍යාපෘතිය අතර මග නවතා දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඇල ඉවුරු නැවත ප්‍රතිසංස්කරණය සඳහා සංස්ථාව විසින් රු.9,001,423 ක් වැය කර තිබුණි.

(ඉ) 2013 අගෝස්තු 30 දිනැති අංක 13/1144/503/087 දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වේරස්ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 14,227 ක ණය මුදලක් මහා භාණ්ඩාගාර ඇපකරය මත ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් සංස්ථාව වෙත ලබා දී තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2014 ජූලි 14 දින වසර 14 ½ කින් ණය මුදල ආපසු ගෙවීමේ එකඟතාව මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. නුගේගොඩ, රත්තනපිටිය, බොරලැස්ගමුව, පිළියන්දල හා වේරහැර ප්‍රදේශ වල වර්ෂා සමයේ හටගන්නා ගංවතුර පාලනය කිරීම , පවතින ඇළ මාර්ග පුළුල් කිරීම, ඇළ ඉවුරු ආරක්ෂාව, ගංවතුර රැඳවුම් ප්‍රදේශ ආරක්ෂාකරමින් වැව් ඉදිකිරීම, නව බෝක්කු හා පාලම් ඉදිකිරීමද ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු විය. එමෙන්ම 2017 දෙසැම්බර් 07 දිනැති හා අංක අමප/17/2561/724/112 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රු. මිලියන 14,227 ක් සඳහා එකග වූ ණය ගිවිසුම අහෝසි කර එදිනට ලබාගත් ණය මුදල වන රු. මිලියන 2,550 වෙනුවෙන් නව ණය ගිවිසුමකට එළඹීමට සහ අදාළ ණය වාරික හා පොලී ගෙවීමට අවශ්‍ය මුදල් හා ව්‍යාපෘතිය අඛණ්ඩව කර ගෙන යාම සඳහා වන වියදම වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදනය කිරීමටද යෝජනා වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 ඔක්තෝබර් 04 දින ආරම්භ වී වසර 5 කින් එනම් 2018 ඔක්තෝබර් 24 දින ව්‍යාපෘතිය නිමකිරීමට අපේක්ෂා කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ව්‍යාපෘතිය සඳහා වසර 04 කට අධික කාලයක් ගතවී තිබුණු බැවින් ව්‍යාපෘතිය නිම කළ යුතු කාලය සමඟ සැසඳීමේදී සියයට 80 ක ප්‍රගතියක් වාර්තා කළයුතු වුවත් එදිනට තත්‍ය භෞතික ප්‍රගතිය සියයට 43 කට ආසන්න ප්‍රමාණයක් බව විගණනයට ඉදිරිපත්කළ ලේඛන මඟින් තහවුරු විය. එසේ වුවත් ව්‍යාපෘතියේ අසාමාන්‍ය කාල ප්‍රමාදයක් වලක්වා ගෙන නියමිත කාලයට ව්‍යාපෘතිය නිම කළ හැකි නව වැඩ පිළිවෙලක් කළමනාකරණය විසින් හඳුන්වාදී නොතිබුණි. තවද ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 11,050 ක් ලෙස එනම් ඇස්තමේන්තුගත පිරිවැය සියයට 23 කින් අඩු කිරීම තුළින් ව්‍යාපෘතිය මඟින් ඉටු කිරීමට අපේක්ෂිත විෂය පථය ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය විසින් මාස 03 ත් මාස 06 ත් වැනි කෙටි කාලයක් තුල වැඩ අවසන් කල යුතු කොන්ත්‍රාත් වැඩ 60 ක් පැකේජ වශයෙන් උපකොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඔවුන්ට රු.162,474,128 ක සවලීකරණ (Mobilization) අත්තිකාරම් ලබා දී තිබුණි. මෙයින් ප්‍රමාද කාලය වසර ඉක්මවූ ශේෂයන්ද ඇතුලත්ව නොපියවූ අත්තිකාරම් ශේෂය රු.135,765,060 ක් විය. මේ අනුව ව්‍යාපෘතියේ ණය මුදල් යොදවා අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් මුදල් අසාමාන්‍ය කාලයක් කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(iii) 2017 දෙසැම්බර් 07 දිනැති හා අංක අමප/17/2561/724/112 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංස්ථාව වේරස් ගඟ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබාගත් ණය මුදල වන රු. මිලියන 2,550 ක් සඳහා බැංකුව සමග නව ගිවිසුමකට එළඹිය යුතු වුවද 2018 අගෝස්තු 31 වන විටත් එලෙස නව ගිවිසුමකට එළඹ නොතිබුණි. එමෙන්ම උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ව්‍යාපෘතිය

සඳහා ඉදිරියේදී අවශ්‍ය මුදල් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදනය කරනු ලබන බැවින් ව්‍යාපෘතිය ඉටු කිරීමට ආසන්න වශයෙන් වර්ෂ 10 ක පමණ කාලයක් ගත වුවද එම සංශෝධිත කාල රාමුවට අදාළ වන පරිද සංයුක්ත සැලැස්මක් හෝ ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.

තවද ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භකල කලාප තුල (Zone) ඇල මාර්ග අසල ජීවත්වන නිවාසලාභීන්, ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් තාවකාලිකව ඉවත් කර තිබුණද මෙම කරුණු මත ව්‍යාපෘතිය අපේක්ෂිත කාලය තුල ක්‍රියාත්මක නොකල හොත් විවිධ සමාජීය ගැටළු වලට සංස්ථාවට මුහුණ පෑමට සිදුවන බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ අවසන් කළ යුතු ව්‍යාපෘතිය මගින් ඉකුත් වර්ෂවල ප්‍රදානය කළ රු. මිලියන 108.61 ක් වටිනා උප කොන්ත්‍රාත් 04 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත්හැර දමා තිබුණු අතර ඒ වෙනුවෙන් ව්‍යාපෘතිය දරන ලද වියදම රු. මිලියන 35.56 ක් විය.

(v) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය යටතේ ආරම්භකළ රු.මිලියන 416.66 ක් වටිනා උප කොන්ත්‍රාත් වැඩ 14 ක ඉදිකිරීම් කටයුතු අවසන් විය යුතු වුවද ඒවයේ භෞතික ප්‍රගතිය සියයට 5ත් සියයට 50ත් අතර පහළ අගයක පැවැතුණු අතර ඉන් උප කොන්ත්‍රාත් 10 ක පමා කාලය වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය විසින් එම කොන්ත්‍රාත්වල දින දීර්ඝ කිරීමක් හෝ උප කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමා ගාස්තු (Liquidated Damages) අය කිරීමක් හෝ කර නොතිබුණි. තවද උප කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කළ කාර්යසාධන බැඳුම්කරවල කාලය දීර්ඝ කර ගැනීමටද ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේදී වැඩ අවසන් කළ යුතු ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කළ රු.මිලියන 126.2 ක් වටිනා උප කොන්ත්‍රාත් 4 ක කිසිදු වැඩක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදු කර නොතිබුණු අතර එම කොන්ත්‍රාත් වෙනුවෙන් ව්‍යාපෘතිය මගින් රු. මිලියන 24 ක සචලීකරණ අත්තිකාරම් (Mobilization Advance) ගෙවා තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය යටතේ ලබා දුන් රු. මිලියන 406.53 ක් වටිනා උප කොන්ත්‍රාත් 16 ක භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස දැක්වුවද එම කොන්ත්‍රාත්වල මූල්‍ය ප්‍රගතිය, කොන්ත්‍රාත් වටිනාකම සමග සැසඳීමේදී සියයට 20 ත් සියයට 80 ත් අතර පැවතුණි.

(viii) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර වසර 05 කට අධික කාලයක් ගතව තිබුණද ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධි විධාන පරිදි කිසිදු ඉඩමක් රජයට පවරා ගැනීමේ කටයුතු නිම කිරීමට නොහැකිවී තිබුණු අතර ඉඩම් පනත යටතේ ගැසට් කරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 267.67 ක් විය. මේ හේතුවෙන් නිවාස අහිමිවූ ඇතැම් පවුල්වලට දිගින් දිගටම නිවාස කුලී ලබාදීමට සංස්ථාවට සිදුව තිබිණි. තවද මෙම තත්ත්වය මත සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කළ රු. මිලියන 197.69 ක කොන්ත්‍රාත් 06 ක වැඩ සැලසුම් කළ පරිදි ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ නිම කරන ලද සහ කෙරීගෙන යන ව්‍යාපෘති 29 කට අදාළ සේවාදායකයන් වෙත ඉදිරිපත් කරන ලද ඉන්වොයිස් වටිනාකම රු.2,277,562,146 ක් වූ අතර සේවාදායකයන් විසින් සහතික කරන ලද ඉන්වොයිස් වටිනාකම රු.1,656,214,858 ක් විය. සංස්ථාව විසින් නියමිත කාල රාමුව තුළ ඉන්වොයිස් ඉදිරිපත් නොකිරීම මූලික සැලසුම් වෙනස් වීම හා කොන්ත්‍රාත්වල අඩුපාඩු පැවතීම මෙම තත්ත්වයට බලපා තිබුණි.

(උ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 12 කට අදාළව ඉදිකිරීම් උපදේශකයන් විසින් සහතික කරන ලද කළ වැඩ වටිනාකම් ඉක්මවා සේවා ලාභී ආයතනයන් වෙත රු.163,381,834 ක් ඉන්වොයිස් කිරීමට අදාල වූ හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඌ) සංස්ථාව සතුව ප්‍රමාණවත් භෞතික සහ මානව සම්පත් පැවතියදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ජලාපවහන හා ගොඩකිරීමේ අංශය සහ ඉදිකිරීම් අංශය කොන්ත්‍රාත් වැඩ 119 ක් භාර ගෙන තිබූ අතර ඉන් කොන්ත්‍රාත් 84 ක් එනම් මුළු කොන්ත්‍රාත් ප්‍රමාණයෙන් සියයට 71 ක් උප කොන්ත්‍රාත්කරුවන් මගින් ඉටු කරවාගෙන තිබුණි.

එමෙන්ම මෙම තත්ත්වය මත සංස්ථාවට ලබා ගත හැකිව තිබූ විශාල කොන්ත්‍රාත් ආදායමක් උප කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගෙන තිබුණි.

(එ) පිබිදුනු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හතරැස් කොටුව ප්‍රාදේශීය රෝහල වැඩි දියුණු කිරීම සඳහා රු. මිලියන 63.03 ක් වටිනා කොන්ත්‍රාත් 03ක් සංස්ථාව විසින් ලබා ගෙන එම කොන්ත්‍රාත්තු උප කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා තිබුණු අතර සංස්ථාව සේවායෝජකට ඉදිරිපත් කළ ඇස්තමේන්තුගත ප්‍රමාණ පත්‍ර (BOQ) සහ උප කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කළ ප්‍රමාණ පත්‍ර අතර සියයට 23 ත් සියයට 34 ත් අතර මිල විචලනයක් සිදුව තිබුණි. මෙම විචලනයන්ට අදාළ රේට විශ්ලේෂණයක්ද (Rate Analysis ) සංස්ථාව විසින් සිදුකර නොතිබුණි.

(ඒ) සංස්ථාව විසින් නිසි අධ්‍යයනයකින් තොරව ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් රු. මිලියන 306 ක් වටිනා කොන්ත්‍රාත් 05 ක් පිරිනැමූ මිල ගණන් සහ ඉංජිනේරු ඇස්තමේන්තු අතර සියයට 30 ත් සියයට 45 ත් අතර මිල විචලනයන් සිදුව තිබුණි. තවද කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කළ මිල ගණන් අඩුවීමට හේතුවූ ප්‍රමාණ පත්‍ර රේටයන් ඇගයීමකටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඔ) සංස්ථාව විසින් මූලික ශක්‍යතා අධ්‍යයනයකින් තොරව හා ඉංජිනේරු සැලසුම් සකස් කිරීමකින් තොරව වැල්ලවත්ත ඇලෙහි පාලම ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් වැල්ලවත්ත ශ්‍රී සුගත විහාරය හා ඊට අනුබද්ධ ළමා නිවාසය ගිලා බැසීමකට ලක්ව තිබුණි.

### 6.3.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩ අවසන් කළ යුතු කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 1,767.94 ක් වූ ව්‍යාපෘති 16 ක වැඩ අවසන් කර නොතිබූ අතර ප්‍රමාද කාලය මාස 06 ත් මාස 18 ත් අතර විය.

## 6.4 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම සහ වියදම තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 850 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද සංස්ථාව විසින් 2015 සහ 2016 වර්ෂයන්හි වාර්ෂික වාර්තා, 2018 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.6 නොවිසඳී ඇති විගණන ජේද

ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද පහත සඳහන් කරුණු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නොවිසඳී පැවතුණි.

(අ) වගකිව යුතු පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය වෙත අඛණ්ඩව වෘත්තීය දීමනා ගෙවීම.

(ආ) නිලධාරින්ගෙන් වාහන ණය මත අයකරනු ලබන පොලිය අඛණ්ඩව නැවත ප්‍රතිපූර්ණය කර තිබීම.

(ඇ) සංස්ථාව විසින් රු.මිලියන 30.2 ක පිරිවැයක් දරා සංවර්ධනය කරන ලද අක්කර 3.5 ක් වූ ඉඩමක, කැළණිය ප්‍රාදේශීය ලේකම්ගේ සහයෝගය මත කෝවිලක් ඉදිකළ පාර්ශවයකට එරෙහි නීතිමය පියවර කඩිනමින් ගන්නා ලෙස 2012 නොවැම්බර් 30 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණි. කෙසේ වෙතත් , අදාල නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම.

(ඈ) සේවක අර්ථ සාධක සහ සේවක භාරකාර අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු දායක මුදල් ගණනය කිරීමේදී අදාල පනත් සහ චක්‍රලේඛ මගින් නියම කර ඇති දීමනා හා වෙනත් පාරිශ්‍රමික ගෙවීම් ගණනය කර නොතිබීම.

(ඉ) වේරස්ගඟ වැසි ජලය අපවහන හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ආරම්භ කළ හා අවසාන කළයුතු කාලවකවානු තුල උක්ත ව්‍යාපෘතිය නිමකරන ආකාරය දැක්වෙන පරිදි කාල නිර්ණයන් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මක් (Time Frame) හා ඇල මාර්ග, පාලම්, බෝක්කු, නඩත්තු මාර්ග, ජල රැඳවුම් ප්‍රදේශ ආදියට අදාලව, යෝජිත වැඩ ලැයිස්තුවක් (Work Schedule/Inventory) පිළියෙල කිරීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

(ii) ව්‍යාපෘතිය මගින් අනාගතයේ ඇතිවිය හැකි ගංවතුර ආපදා තත්ත්වයන් හඳුනා ගැනීම, ඒවායේ අවම හා උපරිම ප්‍රමාණයන් කුමක්ද යන්න හා එමගින් ඇතිවිය හැකි අවදානමේ තත්ත්වයන්ද හඳුනාගෙන නොතිබීම.

(iii) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගෙන තිබූ කලාප (Zone) සහ උප ව්‍යාපෘති (Packages) වෙනුවෙන් පිළියෙල කළයුතු මාසික හා වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම.

(iv) ව්‍යාපෘතියට අදාල කලාප අංක 1,2 සහ 3 හි ගේබියන් බැම් (Gabian Structure) සැකසීම සඳහා රු. 281,461,659 ක අධිඇස්තමේන්තු සකසා තිබුණු අතර ඒ මත කොන්ත්‍රාත්කරුවන්ට සවලිකරන අත්තිකාරම් වැඩිපුර ගෙවා තිබීම.

(v) සම්මත ප්‍රමිතීන්ට අනුව ගේබියන් බැම් බැඳීම සඳහා අඟල් 4 x 6 (100*150mm) කළු ගල් පමණක් භාවිතා කල යුතු වුවත් එම ප්‍රමාණයේ කළු ගල් භාවිතා කර තිබුණේ ඉදිකිරීම් වලින් සියයට 25 කටත් අඩු ප්‍රමාණයකින් බව ඒ පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. ඉතිරි සියයට 75 කට වැඩි ප්‍රමාණය සඳහා අඟල් 12 x16 (200 x 400mm) කළුගල් භාවිතා කර තිබූ බව

නිරීක්ෂණය විය. එමෙන්ම මෙම තත්ත්වය බ්‍රිතාන්‍ය ප්‍රමිත අංක BS 8002,1984 ට පටහැනි විය. මෙම ප්‍රමිතයට අනුව Gabian boxes වලට ගල් ඇතිරීමේදී භාවිතයට ගත හැකි කළු ගල් වල උපරිම ප්‍රමාණය 200mm වේ.මෙම තත්ත්වය යටතේ Gabian boxes තුල එලෙස විශාල ගල් ඇතිරීම මගින් ඒවාට හානි වීම සිදුවිය හැකි අතර සම්මත ප්‍රමිතීන්ට අනුව මෙම බැම් ඉදිකර නොතිබීම.

(vi) කලාප අංක I හි දිග මීටර් 2,889 ක කොටසක ඇල මාර්ග සංවර්ධනයට අදාල වැඩ කොටස් උප ව්‍යාපෘති 34 කට කොටස් කර කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර එම කොටස් මීටර් 54, මීටර් 68, මීටර් 100 සහ මීටර් 110 ලෙස ඉතා කුඩා කොටස් වලට මුළු කොන්ත්‍රාත්තුව වෙන් කිරීමට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකිරීම මෙන්ම මේ තත්ත්වය යටතේ දිග මීටර් 2,889 ක ඇල මාර්ගය සංවර්ධනයට පුවත්පත් දැන්වීම් භාෂා 3 කින් පලකිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුව තිබීම එසේම මෙකී සෑම උපකොන්ත්‍රාත්තුවක් සඳහාම සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිළි ඉදිකිරීම, කාර්යාල ඉදිකිරීම, කාර්මික නිලධාරීන් වෙන් කිරීම් යනාදිය වෙනුවෙන් රු. මිලියනය ඉක්මවූ මූලික වියදම් (Preliminaries) ඇස්තමේන්තු කර ගෙවීමට කටයුතු කර තිබීම.

(vii) ව්‍යාපෘතියේ රත්තනපිටිය කටු ඇල මාර්ගය සංවර්ධනය කිරීමේ වැඩ සටහනේදී රත්තනපිටිය පරණ කැස්බෑව පාරේ ව්‍යාපාරික ස්ථානයට පිවිසීමට ඇති පාලමක් කඩා ඉවත් කර, ඇල මාර්ගය සකස් කිරීමෙන් පසු නැවත එම පාලම ඉදිකර දීමට ව්‍යාපෘතිය විසින් සැලසුම්කර තිබුණු අතර ඊට අමතරව ඉවත්කරන පාලම වෙනුවෙන් රු.මිලියන 1.84 ක් ව්‍යාපාර හිමිකරුට ගෙවීමට කටයුතු කර තිබීම.

(viii) ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක්වන පුද්ගලයින්ට සහන දීමනා ගෙවීමේදී ඒ වෙනුවෙන් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණද එලෙස නිරීක්ෂණ ලබාගැනීමකින් තොරව සංස්ථාව විසින් රු.මිලියන 31.07 ක් ගෙවා තිබිම.

(ix) දේපලවල අයිතිය තහවුරු කර ගැනීමේ කමිටුවේ නිර්දේශ ලබාගැනීමකින් තොරව ඉකුත් වර්ෂය අවසානයට සංස්ථාව අනු පවුල් 12 ක් වෙනුවෙන් රු.මිලියන 3 ක් වන්දි වශයෙන් ගෙවා තිබීම.

(x) සංස්ථාව විසින් අමාත්‍ය මණ්ඩල තීරණයකින් තොරව හා රජයේ තක්සේරුකරුගෙන් වන්දි වාර්තාවක් ලබාගැනීමකින් තොරව ආරක්ෂක හේතූන් මත ඉවත්කරන ඉදිකිරීම් හා නිර්මිතයන් වෙනුවෙන් ඉකුත් වර්ෂය අවසානයට රු.මිලියන 35.52 ක් ගෙවා තිබීම.

(ඊ) ඉකුත් වර්ෂයේදී ඒකල මඩම හංදිය, වාලුකාරාම පන්සලට යාබද අක්කර 04 ක පමණ ඉඩම අනවසරව ගොඩ කරන බව හා ඒ වෙනුවෙන් කඩිනමින් පියවර ගන්නා ලෙසට ජා ඇල ප්‍රාදේශීය ලේකම් වරයා සංස්ථාවට දන්වා තිබුණද සංස්ථාව කඩිනමින් ඒ පිළිබඳ නිරීක්ෂණයක් නොකර ස්ථානීය පරීක්ෂාවෙන් දින 10 කට පසු පැමිණිල්ල විභාග කිරීමට ඉඩම අනවසර ගොඩකල පුද්ගලයා කැඳවා තිබීම හේතුවෙන් එම කාලය තුළ අනවසරකරු යථෝක්ත ඉඩම සම්පූර්ණයෙන් අනවසර ලෙස ගොඩකර තිබීම.

තවද පැමිණිල්ල ලැබී මාස 02 කට පසු සංස්ථා පනතේ බලතල අනුව අනවසර ගොඩ කිරීම සම්බන්ධව සංස්ථාව නඩු පවරා තිබුනද විෂය ගත ඉඩම ගොඩකිරීම හේතුවෙන් ප්‍රදේශයේ වැසි ජලය ගලා යාම හා ජල ගැලීම් රටාවට වන අහිතකර බලපෑම පිළිබඳ කරුණු පැහැදිලි කිරීමට සංස්ථාව අපොහොසත්වීම මත අධිකරණය විසින් නඩුව ප්‍රතික්ෂේප කර තිබීම.

(උ) අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සංස්ථාවට අයත් පර්චස් 3.05 ක ඉඩමක් 1993 වර්ෂයේදී 99 අවුරුදු බදු කාලසීමාවකට පුද්ගලයෙකුට බදු දී තිබුණද 2005 වර්ෂයේදී එම බදු ගිවිසුම අවලංගු කර ඉතිරි බදු කාලය වන වසර 84 ක් සඳහා වෙනත් බදු කරුවකුට එම ඉඩම නැවත තක්සේරු කිරීමකින් තොරව, මුල් ගිවිසුමේ සඳහන් තක්සේරු වටිනාකමටම ලබාදී තිබුණු අතර එම පාර්ශවය 2010 වර්ෂයේදි උක්ත ඉඩම තවත් පාර්ශවයකට උප බදු දී තිබුණි. උප බදු ගිවිසුම වලට එළඹීමට මුල් බදු ගිවිසුමේ ප්‍රතිපාදන නොතිබියදී සහ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත එළඹී බදු ගිවිසුමක් අවලංගු කර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත නව බදු ගිවිසුම්වලට එළඹීමට සංස්ථාව කටයුතු කර තිබීම.

(ඌ) ඉකුත් වර්ෂයේදී සංස්ථාව රු. මිලියන 73.71 ක් වටිනා Steel sheet file මිලදි ගැනීමේදි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 වගන්තිය අනුව රේඛිය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පිහිටුවන ලද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් බැහැරව වෙනත් කමිටුවක් ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබීම.

(එ) මූල්‍ය ප්‍රකාශන තුල විලම්භිත ආදායමක් (Differed Income) ලෙස පෙන්විය යුතු වේරස්ගඟ ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද හා මහා භාණ්ඩාගාරයෙන් අය විය යුතු වටිනාකම වූ රු.මිලියන 3,332.94 ක් සංස්ථාවේ ආදායමක් ලෙස දැක්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ සංස්ථාවේ ආදායම එම වටිනාකමින් අධිගණනය වීම.

## 6.7 සමාජ වගකීම් ඉටු කිරීම

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් ලංකාවේ පළාත් 5 ක පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ඉඩම් වල මායිම් ගැසට් කර තිබුණද එම ඉඩම් ප්‍රදේශ වල අනවසර ගොඩකිරීම, අනවසර පදිංචිවීම් හඳුනාගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර එම තත්ත්වයන් පරීක්ෂා කිරීම වෙනුවෙන් නිළධාරීන්ද අනුයුක්ත කර නොතිබුණි. මේ හේතුවෙන් අනාගතයේදී විවිධ සමාජයීය හා පාරිසරික ගැටළු වලට සංස්ථාවට ඍජුව මුහුණ දීමට සිදු නොවේ යැයි විගණනයේදී පිළිගත නොහැකි විය.

(ආ) වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර වසර 05 කට අධික කාලයක් ගතවී තිබුණද එහි ප්‍රගතිය ඉතා පහල මට්ටමක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක්වූ නිවාස ලාභීන්ගේ නිවාස නැවත තනාගැනීමට නොහැකිව වර්ෂ කිහිපයක සිට අසරණභාවයට පත්ව තිබුණි. එමෙන්ම ඇල මාර්ගයට මායිම් වුවද පවරානොගත් ඉඩම් කැබලි වල පිහිටි ඇතැම් නිවාස ඇල මාර්ගයේ සංවර්ධන කටයුතු හේතුවෙන් ගිලා බැස ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. නිසි සැලසුමකින් හා අධ්‍යයනයකින් තොරව ඉඩම් අත්පත් කර ගැනීම, ඇල මාර්ග සංවර්ධනයට යල්පැන ගිය යන්ත්‍රෝපකරණ භාවිතය මත සිදුවන කම්පනය (Vibration) මෙම තත්ත්වයට ඍජුව බලපා තිබුණි. එමෙන්ම මෙවැනි ස්ථානවල ඇල මාර්ග සංවර්ධන කටයුතු අත්හිටුවා තිබුණු අතර මෙම ගැටළු නිරාකරණයට අදාල විසඳුම් ලබාදීමටද සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ඇ) මහ කොළඹ ඇල මාර්ග හා කාණු පද්ධති පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ රජයට පවරාගන්නා ලද සංස්ථාවේ අධීක්ෂණය හා පාලනය යටතේ පවතින ඉඩම් අක්කර 990 කින් අක්කර 62 ක විවිධ පුද්ගලයින් අනවසරයෙන් පදිංචි වී තිබුණි. මේ අතුරින් ඇතැම් ඉඩම් කොටස් නගර සභා විසින් සින්නක්කර ඔප්පු යටතේ විවිධ පාර්ශවයන් වෙත පවරාදී තිබුණි.

සංස්ථාව විසින් ව්‍යාපෘතිය යටතේ රජයට පවරාගන්නා ලද ඉඩම්, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි නොකිරීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මෙම ඉඩම්වලින් අක්කර 79ක් සංස්ථාව විසින් අවසතු කර (Divesting) තිබුණු අතර ඇතැම් අවසතුකිරීම් හේතුවෙන් ජලරැඳවුම් ප්‍රදේශවලට සිදුවිය හැකි හානිය පිළිබඳ තක්සේරු කිරීම සඳහා තාක්ෂණික අධ්‍යයනයක් සිදු කිරීමකින්ද තොරව එම අවසතු කිරීම් සිදුකර තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) තොග පාලනය | (i) සංස්ථාවේ ඇතැම් වැඩ බිම් සඳහා ගබඩා භාරකරුවකු සහ ආරක්ෂක නිලධාරින් සේවයේ යොදවා නොතිබුණු අතර එම වැඩ බිම් වල තොග ලේඛන හෝ ආරක්ෂක අංශ විසින් නඩත්තු කළ යුතු ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම. |
| | (ii) සංස්ථාව සතු ගබඩාවල භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම තොග ලේඛනවල සටහන් නොකිරීම හේතුවෙන් යම් අවස්ථාවක තොගයේ පවතින ශේෂයන් හඳුනාගැනීමට නොහැකිව තිබුණු අතර උප ගබඩා වල පවතින තොග ශේෂයන් පිළිබඳව වාර්තාවක් මාසිකව ප්‍රධාන ගබඩාවට ලබාදී නොතිබීම, එමෙන්ම ප්‍රධාන ගබඩාවේ පවතින තොග ශේෂ පිළිබඳව මාසික වාර්තාවක් ප්‍රධාන කාර්යාලයට ලබාදී නොතිබීම.<br><br>මෙම තත්ත්වය මත කාර්යක්ෂම තොග කළමනාකරණයක් සිදු කිරීමට සංස්ථාවට නොහැකි වී තිබීම. |
| (ආ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) සැලසුම්ගත ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම, කොන්ත්‍රාත්වල ප්‍රගතිය පහල මට්ටමක පැවතීම හා ඉදිකිරීම් ප්‍රමිතීන්ට අනුගතව ඇතැම් ඉදිකිරීම් කර නොතිබීම. |
| | (ii) සංස්ථාව විසින් ලබාගන්නා බොහොමයන් කොන්ත්‍රාත් උප කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉටු කර ගැනීම සහ එම කොන්ත්‍රාත් සම්බන්ධව ඔවුන් ඉදිරිපත් කරන මිල ගණන් හා සංස්ථාවේ ඇස්තමේන්තුගත මිල ගණන් අතර විශාල මිල විචලනයක් පැවතීම. |
| | (iii) කොන්ත්‍රාත් වෙනුවෙන් සංස්ථාව පිළියෙල කරන ඇස්තමේන්තු සහ එම කොන්ත්‍රාත්වල සත්‍ය පිරිවැය අතර විශාල වෙනස්කම් පැවතීම. |

| | | | |
|---|---|---|---|
| | | (iv) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කොන්ත්‍රාත් ප්‍රදානය නොකිරීම සහ කොන්ත්‍රාත්වලට අදාළ සුරක්ෂණ (Bond) කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | (i) | තරඟකාරිත්වයක් ඇතිවන පරිදි මිල කැඳවීමකින් තොරව කලින් තීරණය කරන ලද මිල ගණන් මත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම. |
| | | (ii) | සංස්ථාවේ සැපයුම් අංශයේ අනුදැනුමකින් තොරව සංස්ථාවේ විවිධ අංශ විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම. |
| | | (iii) | ඉඩම්වල වර්තමාන තක්සේරු වටිනාකම ගණනය කිරීමකින් තොරව ඇතැම් ඉඩම් විකිණීම සහ කල් බදු පදනම මත ලබා දීම. |
| | | (iv) | ගබඩාවට භාණ්ඩ ලැබීමට පෙර සංස්ථාව විසින් ඇතැම් සැපයුම්කරුවන්ට සැපයුමට අදාළ සම්පූර්ණ මුදලම නිදහස් කර තිබීම. |
| (ඇ) | මූල්‍ය කළමනාකරණය | (i) | අත්තිකාරම් මුදල් අදාල කාර්යය නිමවූ විගසම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| | | (ii) | ණය ගිවිසුම් ප්‍රකාරව ණය වාරික හා පොළී කාලීනව පියවීමට කටයුතු කර නොතිබීම. |
| | | (iii) | ණය ලබා ගැනීමේ අරමුණෙන් බැහැරව ලබාගත් ණය මුදල් ආයෝජනය කර තිබීම. |
| | | (iv) | අයවැය තුළ හෝ ක්‍රියාකාරී සැලැස්ම තුළින් අනුමත නොවූ වැඩ සටහන් වෙනුවෙන් වියදම් දැරීම. |
| | | (v) | ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | | (vi) | විවිධ වැඩසටහන් සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදාන අරමුණට පරිබාහිර කටයුතු සඳහා භාවිතා කර තිබීම. |
| | | (vii) | ජාතිය ගොඩනැංවීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමේදී කාල ප්‍රමාදයන් පැවතීම. |
| (ඉ) | ගිණුම්කරණය | (i) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකළ අවස්ථා පැවතීම. |

| | | |
|---|---|---|
| | (ii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වත්කම් හා වගකීම් විෂයයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ඒවායේ වටිනාකම අධි හා ඌන ගණනය වී තිබීම. |
| | (iii) | ජ‘නල් සටහන් තුළ එයට අදාළ උප ලියවිලි (Supporting Documents) ඇතුළත් කර නොතිබීම. |
| (ඊ) සේවා අංශයේ ආරක්ෂක කටයුතු පාලනය | | අළුත් වැඩියා කරන වාහන අමතර කොටස් පරිශ්‍රයෙන් පිටතට ගෙන යාම හා නැවත ගෙන ඒම් සටහන් කිරීමට ආරක්ෂක අංශය ලේඛනයක් නඩත්තු කළද සේවා කරන ඇතැම් වාහනවල අමතර කොටස් මිලට ගැනීමට සහ සේවා කිරීමට පැරණි කොටස් සේවා අංශයෙන් පිටතට ගෙන ගියද ඒවා නැවත භාර නොදුන් අවස්ථා පැවතීම. |
| (උ) සේවා මධ්‍යස්ථානයේ වැඩ පත්‍රිකා කළමනාකරණය | (i) | සංස්ථාවේ සේවා මධ්‍යස්ථානයට ලැබෙන වැඩ වලින් යම් අවස්ථාවක වැඩ අවසන් වූ හා වැඩ අවසන් නොවූ ප්‍රමාණය කොපමණද යන්න හඳුනාගැනීමට ක්‍රමවේදයක් නොතිබීම. |
| | (ii) | වාහන වල සේවා ආරම්භකළ විට හඳුනාගන්නා උප වැඩ සඳහා වෙනමම වැඩ පත්‍රිකාවක් පිළියෙල කළද, එය ප්‍රධාන වැඩ පත්‍රිකාව සමග යාවත්කාලීන නොකිරීම හේතුවෙන් වාහන වල කරන ලද මුළු සේවාවන් මොනවාද යන්න ප්‍රධාන වැඩ පත්‍රිකාව මගින් හඳුනාගත නොහැකිවීම. |